අ.පො.ස (උ.පෙළ) විභාගය - 2016

ඇගයීම් වාර්තාව

32 - ව්‍යාපාර අධ්‍යයනය

Curriculum
Assessment & Evaluation
Teaching Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව.

අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2016

ඇගයීම් වාර්තාව

32 - ව්‍යාපාර අධ්‍යයනය

Curriculum
Assessment & Evaluation
Teaching Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

ව්‍යාපාර අධ්‍යයනය

ඇගයීම් වාර්තාව - අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2016

මූල්‍ය අනුග්‍රහය

අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB) මගිනි

හැඳින්වීම

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය, ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනයේ අවසාන සහතිකකරණ විභාගයයි. ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය අවසානයේ සිසුන්ගේ සාධන මට්ටම සහතික කිරීම මෙම විභාගයේ ප්‍රධාන අරමුණ වුව ද ජාතික විශ්වවිද්‍යාලවලට, වෙනත් උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතනවලට මෙන් ම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට සුදුස්සන් තෝරා ගැනීම ද මෙම විභාගයේ ප්‍රතිඵල මත සිදු කෙරෙන බැවින් සාධන පරීක්ෂණයක් වශයෙන් මෙන්ම තේරීමේ පරීක්ෂණයක් වශයෙන් ද අ.පො.ස.(උ.පෙළ) විභාගය, ඉතා වැදගත් තත්ත්වයක් උසුලයි. එමෙන්ම තෘතීයික මට්ටමේ රැකියා සඳහා ද ප්‍රවේශ සුදුසුකම් සහතික කෙරෙන විභාගයක් වශයෙන් මෙය පිළිගැනේ. 2016 වර්ෂයේ දී මෙම විභාගය සඳහා 211865 ක් පාසල් අයදුම්කරුවෝ ද 46328 ක් පෞද්ගලික අයදුම්කරුවෝ ද පෙනී සිටියහ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද දැඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු නොඅනුමාන ය. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව, I, II හා III යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.

අ.පො.ස.(උ.පෙළ) ව්‍යාපාර අධ්‍යයනය විෂයයෙහි විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ I කොටසෙහි අඩංගු වේ. ඒ යටතේ විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව, ඔවුන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික් මට්ටමින් පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ව්‍යාප්තිය යන විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද ව්‍යාපාර අධ්‍යයනය විෂයයේ I හා II පත්‍රවල ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය, එම ප්‍රශ්නවලට හා එම එක් එක් ප්‍රශ්නයෙහි කොටස්වලට ලකුණු ලබාගෙන ඇති ආකාරය සවිස්තරාත්මකව දැක්වෙන විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණයක් ද අන්තර්ගත වේ. අ.පො.ස.(උ.පෙළ) 2016 විභාගයේ ව්‍යාපාර අධ්‍යයනය විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න හා එම ප්‍රශ්නවලට අයදුම්කරුවන් පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ II කොටසෙහි අඩංගු වෙයි. ඒ යටතේ I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා සංවර්ධනාත්මක යෝජනා අන්තර්ගත වේ.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මගින් උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදාගනිමින් අයදුම්කරුවන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස කාරුණික ව ඉල්ලමි.

මෙම වාර්තාව සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රීයව ආයක වූ සැකසුම් කමිටු සාමාජිකයින්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට හා මෙම කාර්ය සඳහා මූල්‍ය අනුග්‍රහය දැක්වූ අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB)ටත් මාගේ හෘදයාංගම ස්තුතිය පළ කරමි.

බී. සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්

2017 දෙසැම්බර් 01
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල.

උපදේශකත්වය	:	බී. සනත් පූජිත විභාග කොමසාරිස් ජනරාල්
මෙහෙයවීම හා සංවිධානය	:	ගයාත්‍රි අබේගුණසේකර විභාග කොමසාරිස් (පර්යේෂණ/සංවර්ධන හා ඇගයීම්)
සම්බන්ධීකරණය	:	ලසික සමරකෝන් සහකාර විභාග කොමසාරිස් (පර්යේෂණ හා සංවර්ධන)
සංස්කරණය	:	මහාචාර්ය ගාමිනී ද අල්විස් කොළඹ විශ්ව විද්‍යාලය ආචාර්ය එම්. ඩී. පුෂ්පකුමාරි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ව්‍යාපාර පරිපාලන විද්‍යා අධ්‍යයන අංශය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය යූ. එල්. ටී. පී. ගුණසේකර ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කැළණිය විශ්ව විද්‍යාලය
සැකසුම් කමිටුව	:	ඩබ්. එම්. සුදුබණ්ඩා වාණිජ - ගුරු උපදේශක කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පස්සර. ඩබ්ලිව්. එම්. ඒකනායක වාණිජ - ගුරු උපදේශක කලාප අධ්‍යාපන කාර්යාලය, ශ්‍රී ජයවර්ධනපුර. ඩබ්ලිව්. ඩී. රංජිත් ජයනාද ගුරු සේවය I ශාන්ත පීතර විද්‍යාලය, කොළඹ 04. යූ. ජී. ටී. සමන් කුමාරි ගුරු සේවය I බප/ පිළි/ ධර්මරාජ මහා විද්‍යාලය, පිළියන්දල. ෂෙරීන් කණ්ඩම්බි ගුරු සේවය I අනුලා විද්‍යාලය, නුගේගොඩ. වසන්ත ගාමිණී අබේසිංහ විශාඛා විද්‍යාලය, කොළඹ 05.
පරිගණක පිටපත සැකසුම	:	කේ. ඒ. ඩී. තිලානි ලක්මාලි රාජ්‍ය කළමනාකරණ සහකාර ටී. දර්ශිකා නිලුපුලී පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු
පිටකවරය නිර්මාණය	:	වයි.එස්. අනුරාධි සංවර්ධන නිලධාරී

ඇතුළත පිටු

පිටු අංකය

I කොටස

1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 ව්‍යාපාර අධ්‍යයනය විෂයයෙහි අභිමතාර්ථ

මෙම පාඨමාලාව හැදෑරීමෙන් ශිෂ්‍යයා,

- මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුකර ගැනීම හා සම්බන්ධ ගැටලුවලට, ආයතන හෝ සංවිධාන පදනම් කරගෙන විසඳුම් සෙවිය හැකි ආකාර පිළිබඳ ව නිපුණතා වර්ධනය කර ගනියි.
- ගතික ව්‍යාපාර පරිසරය අවබෝධ කර ගැනීම මගින් එයට අනුවර්තනය වීමට අවශ්‍ය කුසලතා ලබා ගනියි.
- ව්‍යාපාර හා ඊට සම්බන්ධ උපකාරක සේවා පිළිබඳ ව ලබාගන්නා න්‍යායාත්මක දැනුම ප්‍රායෝගිකව භාවිත කරයි.
- ව්‍යාපාර හා සම්බන්ධ සංකල්ප හා මූලධර්ම අධ්‍යයනය කිරීමටත්, සංකීර්ණ විෂය කරුණු සරල ව ග්‍රහණය කර ගැනීමටත් නිපුණතා වර්ධනය කර ගනියි.
- ව්‍යවසායකත්ව හා කළමනාකරණ කුසලතා වර්ධනය කර ගනියි.
- ව්‍යාපාර පද්ධතියක ශ්‍රිත අතර සමෝධානිත බව පෙන්වා දෙයි.
- දේශීය, කලාපීය හා ගෝලීය වශයෙන් ව්‍යාපාරවල නිරත වීමට අවශ්‍ය මූලික නිපුණතා ලබා ගනියි.
- ශ්‍රී ලංකාව තුළ යහපත් ව්‍යාපාර සංස්කෘතියක් ඇති කිරීම සඳහා අවශ්‍ය ආකල්ප ගොඩනගා ගනියි.
- සැලසුම් සහගතව ව්‍යාපාර ආරම්භ කිරීමට හා පවත්වාගෙන යාමට අවශ්‍ය කුසලතා ලබාගනියි.
- වෘත්තීය භූමිකාවල සාර්ථක ව කටයුතු කිරීමට අවශ්‍ය නිපුණතා ලබා ගනියි.
- සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා කළමනාකරණය හා නූතන තාක්ෂණය භාවිත කිරීමේ කුසලතා වර්ධනය කරගනියි.
- උසස් අධ්‍යාපනයට යොමු වීම උදෙසා ප්‍රවේශයක් ලබා ගනියි.

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

1.2.1 විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

මාධ්‍යය	පාසල්	පෞද්ගලික	එකතුව
සිංහල	41566	4502	46068
දෙමළ	7593	1159	8752
ඉංග්‍රීසි	1977	839	2816
එකතුව	**51136**	**6500**	**57636**

වගුව 1

1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

ශ්‍රේණිය	පාසල් අයදුම්කරුවන්		පෞද්ගලික අයදුම්කරුවන්		එකතුව	ප්‍රතිශතය
	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය		
A	8640	16.90	690	10.62	9330	16.19
B	9894	19.35	859	13.22	10753	18.66
C	15132	29.59	1663	25.58	16795	29.14
S	13212	25.84	2016	31.02	15228	26.42
F	4258	8.32	1272	19.56	5530	9.59
එකතුව	**51136**	**100.00**	**6500**	**100.00**	**57636**	**100.00**

වගුව 2

1.2.3 ප්‍රථම වරට පෙනීසිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

දිස්ත්‍රික්කය	පෙනී සිටි සංඛ්‍යාව	විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ		අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ		සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ		සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ		සමත් (A+B+C+S)		අසමත් (F)	
		සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
1. කොළඹ	8128	1509	18.57	1616	19.88	2323	28.58	2071	25.48	7519	92.51	609	7.49
2. ගම්පහ	4829	950	19.67	872	18.06	1404	29.07	1228	25.43	4454	92.23	375	7.77
3. කළුතර	2266	324	14.30	401	17.70	675	29.79	639	28.20	2039	89.98	227	10.02
4. මහනුවර	2823	376	13.32	477	16.90	798	28.27	848	30.04	2499	88.52	324	11.48
5. මාතලේ	745	101	13.56	130	17.45	202	27.11	211	28.32	644	86.44	101	13.56
6. නුවරඑළිය	1091	133	12.19	197	18.06	373	34.19	287	26.31	990	90.74	101	9.26
7. ගාල්ල	2206	381	17.27	378	17.14	597	27.06	635	28.79	1991	90.25	215	9.75
8. මාතර	1281	191	14.91	257	20.06	372	29.04	341	26.62	1161	90.63	120	9.37
9. හම්බන්තොට	788	110	13.96	134	17.01	235	29.82	230	29.19	709	89.97	79	10.03
10. යාපනය	855	123	14.39	126	14.74	231	27.02	274	32.05	754	88.19	101	11.81
11. කිලිනොච්චි	140	14	10.00	26	18.57	47	33.57	43	30.71	130	92.86	10	7.14
12. මන්නාරම	191	10	5.24	27	14.14	62	32.46	71	37.17	170	89.01	21	10.99
13. වව්නියාව	334	33	9.88	46	13.77	115	34.43	107	32.04	301	90.12	33	9.88
14. මුලතිව්	140	21	15.00	28	20.00	52	37.14	36	25.71	137	97.86	3	2.14
15. මඩකලපුව	641	92	14.35	116	18.10	187	29.17	189	29.49	584	91.11	57	8.89
16. අම්පාර	869	85	9.78	127	14.61	260	29.92	277	31.88	749	86.19	120	13.81
17. ත්‍රිකුණාමලය	617	83	13.45	107	17.34	170	27.55	178	28.85	538	87.20	79	12.80
18. කුරුණෑගල	2204	352	15.97	433	19.65	660	29.95	553	25.09	1998	90.65	206	9.35
19. පුත්තලම	1251	191	15.27	237	18.94	404	32.29	309	24.70	1141	91.21	110	8.79
20. අනුරාධපුරය	1230	195	15.85	229	18.62	360	29.27	336	27.32	1120	91.06	110	8.94
21. පොළොන්නරුව	539	65	12.06	110	20.41	145	26.90	149	27.64	469	87.01	70	12.99
22. බදුල්ල	1295	121	9.34	195	15.06	395	30.50	429	33.13	1140	88.03	155	11.97
23. මොනරාගල	642	95	14.80	122	19.00	199	31.00	169	26.32	585	91.12	57	8.88
24. රත්නපුරය	1743	231	13.25	342	19.62	527	30.24	467	26.79	1567	89.90	176	10.10
25. කෑගල්ල	1321	206	15.59	233	17.64	375	28.39	372	28.16	1186	89.78	135	10.22
සමස්ත දිවයින	**38169**	**5992**	**15.70**	**6966**	**18.25**	**11168**	**29.26**	**10449**	**27.38**	**34575**	**90.58**	**3594**	**9.42**

වගුව 3

1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව


පන්ති ප්‍රාන්තරය	සංඛ්‍යාතය	සංඛ්‍යාත ප්‍රතිශතය	සමුච්චිත සංඛ්‍යාතය	සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය
91-100	86	0.15	57636	100.00
81-90	2929	5.08	57550	99.85
71-80	8785	15.24	54621	94.77
61-70	11401	19.78	45836	79.53
51-60	12416	21.54	34435	59.75
41-50	11283	19.58	22019	38.20
31-40	7261	12.60	10736	18.63
21-30	2779	4.82	3475	6.03
11-20	646	1.12	696	1.21
01-10	49	0.09	50	0.09
00-00	1	0.00	1	0.00

වගුව 4

ඉහත වගුව අනුව මෙම විෂයය සඳහා පෙනී සිටි 57636 දෙනා අතුරෙන්, 31-40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ඇති සංඛ්‍යාව 7261 කි. එය ප්‍රතිශතයක් වශයෙන් 12.60 කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති සංඛ්‍යාව 10736ක් වන අතර එය ප්‍රතිශතයක් වශයෙන් 18.63 කි.

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය


1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය



ප්‍රස්තාරය 1 (RD/16/05/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයට අනුව අපේක්ෂකයන් වැඩිම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 06 වන ප්‍රශ්නයට ය. එහි ප්‍රතිශතය 94%කි. එමෙන්ම අපේක්ෂකයන් අඩුම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 41 වන ප්‍රශ්නයටය. එහි ප්‍රතිශතය 15%කි. 5, 41, 44, 47, 50 යන ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයින් 35% කට වඩා අඩු ප්‍රමාණයකි.


1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය



උදාහරණයක් වශයෙන් ගතහොත්, පිළිතුරු සැපයීම සඳහා ප්‍රශ්න තෝරා ගැනීමේදී 01 වන ප්‍රශ්නය 99%ක් පමණ පිරිසක් තෝරාගෙන ඇති අතර 08වන ප්‍රශ්නය තෝරාගත් පිරිස 31%ක් පමණ වේ. ප්‍රශ්න තෝරා ගැනීමේදී 1, 2, 3, 5 යන ප්‍රශ්න 80%කට වැඩි පිරිසක් තෝරාගෙන ඇත.

ප්‍රස්තාරය 2 (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)


1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය



උදාහරණයක් වශයෙන් මෙහි පළමු ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 20කි. මෙම ප්‍රස්තාරයට අනුව එම ලකුණුවලින් 16 - 20 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ගත් අපේක්ෂකයන් 20%ක් පමණ වේ. 11 - 15 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ගත් අපේක්ෂකයන් 42%ක් පමණ වේ. 6 - 10 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ගත් අපේක්ෂකයන් 31% ක් පමණ වේ. 0-5 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ගත් අපේක්ෂකයන් 07% ක් පමණ වේ. 5, 6, 8 යන ප්‍රශ්න සඳහා 76%කට වඩා ලකුණු ලබා ගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 10%කට වඩා අඩු මට්ටමක පවතී.


ප්‍රස්තාරය 3 (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

1.3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය



ප්‍රස්ථාරය 4.1 (RD/16/04/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2016
32 - ව්‍යාපාර අධ්‍යයනය - II පත්‍රය - II කොටස
ප්‍රශ්නවල පහසුතා දර්ශකය



ප්‍රස්තාරය 4.2

II කොටස

2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 02 කි. මුළු ලකුණු 100කි.

- **1 - 30** දක්වා බහුවරණ ප්‍රශ්න **30**කින් ද **31 - 40** දක්වා සුදුසු වචන යොදා හිස්තැන් පිරවීමේ ප්‍රශ්න **10**කින්ද, **41 - 50** දක්වා නිශ්චිත පිළිතුරු සැපයීමේ ප්‍රශ්න **10**කින්ද සමන්විතය.

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයීම අපේක්ෂිතය.

- එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100** කි.

2.1.2 I ප්‍රශ්න පත්‍රය (ප්‍රශ්න අංක 1 සිට 30 දක්වා)

1. පාරිභෝගිකයකු විසින් තම අවශ්‍යතා හා වුවමනා ඉටුකර ගැනීම සඳහා භාණ්ඩ හා සේවා මිල දී ගැනීමේ දී මූලික වශයෙන් සලකා බලනු ලබන සාධක වන්නේ,

(1) වියදම හා ඇසුරුමයි. (2) ඇසුරුම හා ගුණත්වයයි.
(3) තෘප්තිය හා වෙළෙඳ නාමයයි. (4) වියදම හා වෙළෙඳ නාමයයි.
(5) වියදම හා තෘප්තියයි. (……)

2. පහත සඳහන් දෑ අතුරෙන් ආරම්භයේ සිට ම ජාත්‍යන්තර වෙළෙඳපොළ මූලික කරගත් (Born Global) ව්‍යාපාරයක් වන්නේ,

(1) මෝටර් රථ (Motor vehicles) ය. (2) විදුලි උපකරණ (Electrical equipment) ය.
(3) ඇඟලුම් (Apparel) ය. (4) ඉදිකිරීම් (Constructions) ය.
(5) සමාජ ජාලා අඩවි (Social network sites) ය. (……)

3. නව ව්‍යාපාර ප්‍රවණතාවක් **නො වන්නේ** පහත සඳහන් දෑ අතුරෙන් කුමක් ද?

(1) ගෝලීයකරණය (2) විද්‍යුත් ගනුදෙනු
(3) මහා පරිමාණ නිෂ්පාදන (4) හරිත නිෂ්පාදන
(5) ව්‍යාපාර කටයුතු බාහිර ආයතන මගින් කරවා ගැනීම (Business outsourcing) (……)

4. පහත වගුවේ **X** තීරුව මගින් ව්‍යාපාර වර්ගීකරණ පදනම් කිහිපයක් ද, **Y** තීරුව මගින් එම පදනම් සඳහා නිදසුන් කිහිපයක් ද දැක්වේ.

X	Y
A. අයිතිය	1. මැණික් ගැරීම
B. අරමුණ	2. රාජ්‍ය මැණික් සංස්ථාව
C. පරිමාණය	3. මැණික් ඔප දැමීම
D. කර්මාන්ත මූලය	4. මැණික් කර්මාන්තය පිළිබඳ නොමිලයේ උපදේශනය
E. නිෂ්පාදනයේ ස්වභාවය	5. සේවකයින් දෙදෙනෙකුගෙන් සමන්විත මැණික් ව්‍යාපාරය

එක් එක් ව්‍යාපාර වර්ගීකරණ පදනමට ගැළපෙන නිදසුන නිවැරදි ව දක්වා ඇති කාණ්ඩය තෝරන්න.

(1) A - 2, B - 5, C - 3, D - 4, E - 1 (2) A - 2, B - 4, C - 5, D - 1, E - 3
(3) A - 2, B - 3, C - 4, D - 1, E - 5 (4) A - 1, B - 3, C - 2, D - 5, E - 4
(5) A - 4, B - 2, C - 5, D - 1, E - 3 (……)

5. සමන්ත විසින් බේකරි නිෂ්පාදන මිල දී ගෙන අලෙවි කිරීම සඳහා 'සමන්ත හෝටලය' නමින් ව්‍යාපාරයක් පළාත් සභාවේ ද අනුමැතිය ලබාගෙන, ඇඟලුම් කම්හලක් ආසන්නයේ පිහිටි ඔහුගේ නිවසෙහි ආරම්භ කරන ලදී. එයට සේවකයින් දෙදෙනකු බඳවාගත් අතර හෝටලයේ කළමනාකාරිත්වය ඔහුගේ පුතුට පවරනු ලැබිය.

ඒ අනුව සමන්තගේ ව්‍යාපාරය කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශ්වයන් ගණන

(1) 3 කි. (2) 4 කි. (3) 5 කි. (4) 6 කි. (5) 7 කි. (……)

6. පහත වගුවේ දැක්වෙන්නේ සාර්ව පාරිසරික සාධක කිහිපයක් හා එම සාධක සඳහා නිදසුන් කිහිපයකි.

සාර්ව පාරිසරික සාධක	නිදසුන්
A. ප්‍රජා විද්‍යාත්මක	1. රොබෝ තාක්ෂණය දියුණු වීම
B. තාක්ෂණික	2. වයස්ගත ජනගහනයේ වර්ධනය
C. ආර්ථික	3. ලෝක වෙළෙඳපොළේ තෙල් මිල ඉහළ යාම
D. දේශපාලන	4. භාවිත කළ හැකි පොලිතීන් ඝනත්වය නියම කිරීම
E. නීතිමය	5. පස් අවුරුදු ජාතික සංවර්ධන සැලැස්මක් ඉදිරිපත් කිරීම

සාර්ව පාරිසරික සාධක හා නිදසුන් නිවැරදි ව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.

(1) A - 1, B - 2, C - 3, D - 4, E - 5 (2) A - 4, B - 5, C - 2, D - 3, E - 1
(3) A - 2, B - 1, C - 3, D - 5, E - 4 (4) A - 4, B - 3, C - 5, D - 2, E - 1
(5) A - 2, B - 1, C - 5, D - 3, E - 4 (……)

7. ව්‍යාපාර ආයතනයක් විසින් එක් එක් පාර්ශ්වවලට සමාජ වගකීම් ඉටු කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාකාරකම් කිහිපයක් හා ඊට අදාළ පාර්ශ්වවල ලැයිස්තුවක් පහත වගුවේ දැක්වේ.

ක්‍රියාකාරකම්	පාර්ශ්ව
A. ආයතනය තුළ වෛද්‍ය ඒකකයක් පිහිටුවීම	1. රජය
B. ජාතිය ගොඩනැගීමේ බද්දට දායක වීම	2. ගනුදෙනුකරුවන්
C. හිණුම් වාර්තා නියමිත ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම	3. සේවකයන්
D. භාණ්ඩවල අන්තර්ගතය ලේබලයේ සඳහන් කිරීම	4. අයිතිකරුවන්

ඉහත ක්‍රියාකාරකම් හා ඊට අදාළ පාර්ශ්ව නිවැරදි ව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.

(1) A - 1, B - 3, C - 2, D - 4
(2) A - 1, B - 3, C - 4, D - 2
(3) A - 2, B - 4, C - 3, D - 1
(4) A - 3, B - 1, C - 2, D - 4
(5) A - 3, B - 1, C - 4, D - 2 (......)

8. ව්‍යාපාරයක් විසින් තම තරගකරුවන් සැලකිල්ලට ගනිමින් ගොඩ නගා ඇති ආචාර ධර්මයක් වන්නේ,
(1) සියලු සේවකයින්ට සමානව සැලකීමයි.
(2) ප්‍රචාරණයේ දී අන් ව්‍යාපාරික ප්‍රතිරූපවලට හානි නොකිරීමයි.
(3) ආගමික සංකේත ව්‍යාපාර කටයුතුවලට යොදා නොගැනීමයි.
(4) ඉහළ ගුණත්වයකින් යුත් භාණ්ඩ සැපයීමයි.
(5) වැඩිහිටියන්ට ආචාරශීලී වීමයි. (......)

9. පහත සඳහන් ද අතුරෙන් රාජ්‍ය බදු ආදායමක් ලෙස සැලකිය හැක්කේ කුමක් ද?
(1) රියදුරු බලපත්‍ර ගාස්තු
(2) දුම්රිය ගාස්තු
(3) වරිපනම් ගාස්තු
(4) තැපැල් ගාස්තු
(5) බැංකු ගාස්තු (......)

10. වෙළෙඳ විෂමාචාරයක් ලෙස සැලකිය හැක්කේ පහත ද අතුරෙන් කුමක් ද?
(1) සේවකයින්ට නියමිත දිනට වැටුප් නොගෙවීම
(2) ව්‍යාපාරික ස්ථානය පිරිසිදුව තබා නොගැනීම
(3) සේවකයකු රැකියාවෙන් ඉවත් කිරීම
(4) ලකුණු කළ මිලට වඩා වැඩි මිලකට භාණ්ඩ විකිණීම
(5) ගනුදෙනුකරුවන් සමග මනා සබඳතාවයක් පවත්වා නොගැනීම (......)

11. වරලත් ව්‍යාපාරයක් තුළින් වරලත්ලාභියකුට අත් වන වාසියක් වන්නේ,
(1) ආයෝජනය පිළිබඳ අවදානමක් නොමැති වීමයි.
(2) ලාභය නිශ්චිත වීමයි.
(3) අඩු පිරිවැයකින් වරලත් ව්‍යාපාර බලපත්‍රය ලබා ගැනීමට හැකි වීමයි.
(4) ස්වාධීනව තම ව්‍යාපාර කටයුතු කිරීමට හැකි වීමයි.
(5) වරලත්හිමියාගෙන් පුහුණුව හා උපදෙස් ලබා ගැනීමට හැකි වීමයි. (......)

12. 2007 අංක 07 දරන සමාගම් පණතෙහි සඳහන් වන හවුල් ව්‍යාපාරවලට අදාළ කරුණක් වන්නේ,
(1) හවුල්කරුවන්ගේ ආරවුල් බේරුම් කිරීමයි.
(2) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධනයයි.
(3) හවුල් ව්‍යාපාර ලියාපදිංචි කිරීමයි.
(4) හවුල්කරුවන් සංඛ්‍යාවයි.
(5) හවුල් ව්‍යාපාර විසුරුවා හැරීමයි. (.........)

13. පහත දැක්වෙන්නේ විවිධ ව්‍යාපාර සංවිධානවලට අදාළ ලක්ෂණ කිහිපයකි.

A - වාර්ෂික ගිණුම් වාර්තා ප්‍රසිද්ධ කිරීම
B - අයිතිකරුවන්ගෙන් වෙන් වූ නීතිමය ඒකකයක් වීම
C - පාලනයට අයිතිකරුවන් අනිවාර්යයෙන් ම සම්බන්ධ විය යුතු වීම
D - ලියාපදිංචිය අනිවාර්ය වීම
E - දක්ෂ කළමනාකරුවන් බඳවා ගැනීමට හැකි වීම
F - අයිතිකරුවන්ගේ වගකීම සීමාසහිත වීම

ඉහත දැ අකුරෙන් සීමාසහිත පොදු සමාගමක (PLC) ලක්ෂණ පමණක් අඩංගු කාණ්ඩය තෝරන්න.

(1) A, B, C, D (2) A, B, D, E (3) A, B, D, F (4) A, C, D, F (5) C, D, E, F (……)

14. පහත දක්වා ඇත්තේ සමූපකාර ව්‍යාපාරය හා සම්බන්ධ කරුණු කිහිපයකි.

A - ප්‍රජාතන්ත්‍රවාදී සාමාජික පාලනය
B - රජය පිළිබඳ සැලකිලිමත් වීම
C - සමූපකාර අධ්‍යාපනය, පුහුණුව හා තොරතුරු ලබා දීම
D - භාණ්ඩ හා සේවා අඩු මිලට විකිණීම
E - ස්වෛරීභාවය හා නිදහස
F - විවිධ ක්ෂේත්‍රවල ව්‍යාපාර කටයුතුවල නිරත වීම

ඉහත දැ අකුරෙන් සමූපකාර ප්‍රතිපත්ති පමණක් ඇතුළත් කාණ්ඩය කුමක් ද?

(1) A, B, C (2) A, B, E (3) A, C, E (4) A, C, F (5) B, D, E (……)

15. ව්‍යවසායකත්වය තුළින් ව්‍යවසායකයකුට අත් වන පුද්ගල ප්‍රතිලාභයක් වන්නේ,

(1) දළ දේශීය ආදායම වැඩි වීමයි.
(2) සේවා නියුක්තිය වැඩි වීමයි.
(3) සමාජ තත්ත්වය හා පිළිගැනීම වැඩි වීමයි.
(4) නව භාණ්ඩ හා සේවා පරිභෝජනයට අවස්ථා වැඩි වීමයි.
(5) ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ යාමයි. (……)

16. 'සමාජයීය ව්‍යවසායකත්වය' වඩාත් හොඳින් විස්තර කෙරෙන්නේ,

(1) අවතැන් වූ පුද්ගලයින් සඳහා කුඩාරම් සැපයීම යන්නෙනි.
(2) පාසල් ළමයින් සඳහා නොමිලයේ පොත්පත් බෙදා දීම යන්නෙනි.
(3) තම ව්‍යාපාරයට පවුලේ සාමාජිකයින් හවුල් කර ගැනීම යන්නෙනි.
(4) ඉන්ධන භාවිතය අවම කිරීම සඳහා නවතම උපකරණයක් නිෂ්පාදනය කිරීම යන්නෙනි.
(5) ආබාධිත තරුණ තරුණියන්ට ආයතනය තුළ 10%ක රැකියා ප්‍රතිශතයක් ලබා දීම යන්නෙනි. (……)

17. ස්වයංක්‍රීය බැංකු සේවා (Automated Banking Services) තුළින් බැංකුවකට පමණක් අත් වන වාසියක් වන්නේ,

(1) කාලය ඉතිරි කර ගැනීමට හැකි වීමයි.
(2) සේවා ව්‍යාප්තියෙන් වැඩි ලාභයක් ලැබීමට හැකි වීමයි.
(3) බිල්පත් ගෙවීම පහසු වීමයි.
(4) ගිණුම් පිළිබඳ තොරතුරු පහසුවෙන් ලබා ගැනීමට හැකි වීමයි.
(5) ගිණුම් අතර මුදල් හුවමාරු කිරීමට හැකි වීමයි. (……)

18. 'විද්‍යුත් ව්‍යාපාර' (e-business) වඩාත් හොඳින් විස්තර කෙරෙන්නේ,

(1) පරිගණක ඇසුරෙන් වෙළෙඳ කටයුතුවල නියුතු වීම යන්නෙනි.
(2) ගනුදෙනු සිදු කිරීම සඳහා විද්‍යුත් ජාල භාවිත කිරීම යන්නෙනි.
(3) සමස්ත ව්‍යාපාර ක්‍රියාවලිය මෙහෙයවීම සඳහා විද්‍යුත් ජාල භාවිත කිරීම යන්නෙනි.
(4) ගනුදෙනු සඳහා විද්‍යුත් මුදල් භාවිත කිරීම යන්නෙනි.
(5) ව්‍යාපාර ගිණුම් පිළියෙල කිරීම සඳහා මෘදුකාංග භාවිත කිරීම යන්නෙනි. (……)

19. අපනයන ක්‍රියාවලියේ දී නිර්යාතකරුවකුට තම භාණ්ඩවල වටිනාකම නිශ්චිතව ම ලබා ගැනීම තහවුරු කරන ක්‍රමය කුමක් ද?

(1) නෞභාරපත (2) ණයවර ලිපිය (3) පොරොන්දු නෝට්ටුව
(4) රක්ෂණ සහතිකය (5) චෙක්පත (……)

20. මාර්ගගත ක්‍රමයට භාණ්ඩ මිල දී ගැනීමේ (Online Purchasing) අවස්ථාවකට පමණක් සුවිශේෂී වූ ලක්ෂණය වන්නේ,
(1) භාණ්ඩ තේරීමට හැකි වීම ය.
(2) භාණ්ඩවල මිල ගණන් සැසඳීමට හැකි වීම ය.
(3) අවශ්‍ය භාණ්ඩවලට පමණක් අවධානය යොමු කිරීමට හැකි වීම ය.
(4) ණයපත් මගින් ගෙවීම් කිරීමට හැකි වීම ය.
(5) කේවල් කිරීමට හැකි වීම ය. (……)

21. ව්‍යාපාර ආයතනයකට කාර්යක්ෂමතාව ළඟාකර ගැනීම සඳහා ඉවහල් වන සාධකයක් වන්නේ,
(1) පරිසරය අනුව වෙනස් වීමයි.
(2) මනාව සැලසුම් සකස් කිරීමයි.
(3) සමාජ වගකීම් ඉටු කිරීමයි.
(4) සම්පත් අපතය අවම කර ගැනීමයි.
(5) තරගකාරිත්වයට සාර්ථකව මුහුණ දීමයි. (……)

22. විධායක උපකාරක පද්ධති (Executive Support Systems) පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) මධ්‍ය කළමනාකරණ තීරණ ගැනීම සඳහා සහාය වන පද්ධතියකි.
(2) ඉහළ කළමනාකරණ තීරණ ගැනීම සඳහා සහාය වන පද්ධතියකි.
(3) සන්නිවේදන ක්‍රියාවලියට සහාය වන පද්ධතියකි.
(4) කාලීන වාර්තා සැකසීමට තොරතුරු සපයන පද්ධතියකි.
(5) දෛනික මෙහෙයුම් කටයුතුවලට අදාළ දත්ත වාර්තා කිරීමේ පද්ධතියකි. (……)

23. අග්‍ර කළමනාකරුවන් සඳහා සංකල්පනාත්මක කුසලතාව වැදගත් වන්නේ කුමන හේතුවක් නිසා ද?
(1) එදිනෙදා ව්‍යාපාර කටයුතු සාර්ථක කර ගැනීම සඳහා
(2) තීරණ වඩා හොඳින් ක්‍රියාත්මක කිරීම සඳහා
(3) අන්තර් පුද්ගල සම්බන්ධතා වර්ධනය කර ගැනීම සඳහා
(4) දිගු කාලීන උපාය මාර්ගික තීරණ ගැනීම සඳහා
(5) පහළ මට්ටමේ කළමනාකරුවන් අධීක්ෂණය සඳහා (……)

24. පහත **X** තීරුවේ කළමනාකරණ තනතුරු යුගල කිහිපයක් හා **Y** තීරුවේ දෙපාර්තමේන්තුකරණය කිරීමේ පදනම් කිහිපයක් ඇතුළත් වේ.

X	Y
A. මූල්‍ය කළමනාකරු, අලෙවි කළමනාකරු	1. නිෂ්පාදිත
B. ඇඟලුම් නිෂ්පාදන කළමනාකරු, සම් භාණ්ඩ නිෂ්පාදන කළමනාකරු	2. ක්‍රියාවලි
C. තොග අලෙවි කළමනාකරු, සිල්ලර අලෙවි කළමනාකරු	3. ශ්‍රිතමය
D. තත්ත්ව පරීක්ෂණ කළමනාකරු, ඇසුරුම් කළමනාකරු	4. ගනුදෙනුකරු

කළමනාකරණ තනතුරු අනුව දෙපාර්තමේන්තුකරණ පදනම් නිවැරදි ව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.
(1) A - 1, B - 2, C - 3, D - 4
(2) A - 3, B - 1, C - 4, D - 2
(3) A - 3, B - 1, C - 2, D - 4
(4) A - 2, B - 4, C - 1, D - 3
(5) A - 2, B - 1, C - 4, D - 3 (……)

25. පහත වගුවේ **X** තීරුව මගින් අලෙවිකරණ සන්නිවේදන මිශ්‍ර (අලෙවි ප්‍රවර්ධන ක්‍රම) හා **Y** තීරුව මගින් ඒ සඳහා නිදසුන් කිහිපයක් දැක්වේ.

X	Y
A. ප්‍රචාරණය	1. කූපපත් ඇදීම මගින් ත්‍යාග පිරිනැමීම
B. විකුණුම් ප්‍රවර්ධනය	2. රූපවාහිනී දැන්වීම් පළ කිරීම
C. මහජන සම්බන්ධතා	3. ගෙයින් ගෙට ගොස් භාණ්ඩ අලෙවි කිරීම
D. පුද්ගල අලෙවිය	4. ක්‍රීඩා උත්සව සඳහා අනුග්‍රාහකත්වය ලබා දීම

අලෙවිකරණ සන්නිවේදන මිශ්‍ර අනුව නිදසුන් නිවැරදි ව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.
(1) A - 1, B - 4, C - 2, D - 3
(2) A - 2, B - 1, C - 4, D - 3
(3) A - 2, B - 3, C - 1, D - 4
(4) A - 3, B - 2, C - 4, D - 1
(5) A - 4, B - 2, C - 3, D - 1 (……)

26. සේවකයකුට නායකත්ව නිපුණතාව ප්‍රගුණ කර ගත හැකි පුහුණු ක්‍රමය වන්නේ,
(1) තාක්ෂණික පුහුණුවයි. (2) චර්යා සම්බන්ධ පුහුණුවයි. (3) රැකියාව තුළින් පුහුණුවයි.
(4) සමාකරණ පුහුණුවයි. (5) ආධුනිකත්ව පුහුණුවයි. (……)

27. පහත වගුවේ දැක්වෙන්නේ සංවිධානයක කාර්ය කිහිපයක් හා කළමනාකරණ ශ්‍රිත වේ.

කාර්ය	**ශ්‍රිත**
A. වැඩ බෙදීම	1. සැලසුම්කරණය
B. සේවක අභිප්‍රේරණය	2. සංවිධානකරණය
C. ප්‍රමිති ස්ථාපිත කිරීම	3. මෙහෙයවීම
D. පරිසර විශ්ලේෂණය	4. පාලනය

සංවිධාන කාර්යය අනුව ඊට අදාළ කළමනාකරණ ශ්‍රිතය නිවැරදි ව ගළපා ඇති කාණ්ඩය කුමක් ද?
(1) A - 1, B - 2, C - 3, D - 4 (2) A - 2, B - 1, C - 4, D - 3 (3) A - 3, B - 4, C - 2, D - 1
(4) A - 2, B - 3, C - 4, D - 1 (5) A - 4, B - 3, C - 2, D - 1 (……)

28. කොළඹ කොටස් හුවමාරුවෙහි කාර්ය සඳහා සෘජුව ම සම්බන්ධ **නො වන** පාර්ශ්වය කුමක් ද?
(1) ලැයිස්තුගත සමාගම් (2) සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
(3) තැරැව්කාර සමාගම් (4) භාරකාර බැංකු
(5) සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව (……)

29. සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය හා සංචිතවල එකතුවට වඩා ණය ප්‍රාග්ධනය අඩු නම් එම අනුපාතය හඳුන්වන්නේ,
(1) අධිතෝලන අනුපාතය ලෙස ය. (2) ආයෝජන මත ප්‍රතිලාභ අනුපාතය ලෙස ය.
(3) අවතෝලන අනුපාතය ලෙස ය. (4) ක්ෂණික අනුපාතය ලෙස ය.
(5) ජංගම අනුපාතය ලෙස ය. (……)

30. සෘජු හා අභ්‍යන්තර අරමුදල් සම්පාදන මාර්ගයක් වන්නේ,
(1) කොටස් නිකුතුව ය. (2) බැංකු ණය ය. (3) ණයකර නිකුතුව ය.
(4) රඳවාගත් ලාභ ය. (5) කල්බදු ය. (……)


2.1.3 I ප්‍රශ්න පත්‍රයේ අංක 1 සිට **30** තෙක් ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර
01.	...5...	16.	...4...
02.	...5...	17.	...2...
03.	...3...	18.	...3...
04.	...2...	19.	...2...
05.	...4...	20.	...3...
06.	...3...	21.	...4...
07.	...5...	22.	...2...
08.	...2...	23.	...4...
09.	...3...	24.	...2...
10.	...4...	25.	...2...
11.	...5...	26.	...2...
12.	...4...	27.	...4...
13.	...3...	28.	...2...
14.	...3...	29.	...3...
15.	...3...	30.	...4...

වගුව **05**

නිවැරදි එක් පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 60කි.

2.1.4 I ප්‍රශ්න පත්‍රයේ අංක **1 - 30** තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ



ප්‍රස්තාරය 05

අයදුම්කරුවන්ගෙන් අඩු ම ප්‍රතිශතයක් නිවැරදි ප්‍රතිචාර දක්වා ඇති ප්‍රශ්නය වන්නේ 05වැනි ප්‍රශ්නය යි. මෙහි පහසුතාවය 30% කි.

2.1.5 I ප්‍රශ්න පත්‍රයේ අංක 1 - 30 තෙක් ප්‍රශ්න සඳහා වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස)

ප්‍රශ්න අංකය	නිවැරදි වරණය	එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය					
		1	2	3	4	5	Missing
1	5	1%	15%	7%	2%	75%	-
2	5	12%	2%	23%	3%	59%	-
3	3	4%	1%	49%	18%	28%	-
4	2	6%	86%	6%	1%	1%	-
5	4	5%	20%	32%	30%	12%	1%
6	3	0%	1%	94%	0%	4%	-
7	5	2%	6%	3%	4%	86%	-
8	2	2%	88%	1%	8%	0%	-
9	3	6%	2%	85%	4%	4%	-
10	4	1%	1%	2%	93%	4%	-
11	5	10%	5%	4%	5%	76%	-
12	4	3%	5%	22%	65%	6%	-
13	3	3%	10%	70%	13%	3%	-
14	3	5%	11%	74%	4%	7%	-
15	3	1%	2%	89%	6%	2%	-
16	4	8%	5%	5%	59%	22%	-
17	2	8%	75%	2%	9%	6%	-
18	3	12%	17%	68%	3%	1%	-
19	2	20%	58%	15%	6%	1%	-
20	3	5%	9%	46%	29%	12%	-
21	4	1%	34%	2%	59%	3%	-
22	2	10%	75%	3%	4%	8%	-
23	4	3%	12%	7%	74%	4%	-
24	2	1%	79%	5%	2%	12%	
25	2	2%	87%	7%	2%	3%	-
26	2	2%	39%	31%	11%	16%	-
27	4	2%	3%	11%	73%	11%	-
28	2	4%	64%	8%	18%	6%	-
29	3	17%	8%	70%	2%	3%	-
30	4	14%	4%	5%	76%	2%	-

වගුව 06

* එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.

* Missing යනුවෙන් දක්වා ඇත්තේ, ප්‍රශ්නය සඳහා වරණ තෝරා නැති අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය යි.

* I පත්‍රයේ ප්‍රශ්න අංක 01 සිට 30 දක්වා පිළිතුරු සැපයීමේ දී,

උදා:- 06 වන ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගෙන් වැඩි ම ප්‍රතිශතයක් එනම් 94% ක් නිවැරදි ප්‍රතිචාර දක්වා තිබේ.

2.1.6 I ප්‍රශ්න පත්‍රයේ අංක 1 - 30 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිගමන හා යෝජනා

1-30 දක්වා බහුවරණ ප්‍රශ්න සැලකූ විට ප්‍රශ්න අංක 3, 5, 20, 26 ප්‍රශ්නවල පහසුතාව 50%කට වඩා අඩු ය. එම ප්‍රශ්නවලට අදාළ ඒකක හා එක් එක් ප්‍රශ්නවල පහසුතාව පහත දැක්වේ.

පාඩම් ඒකක	**ප්‍රශ්න අංක**	**පහසුතාව**
ව්‍යාපාර පදනම	03	49%
ව්‍යාපාර පදනම	05	30%
වෙළෙඳාම	20	46%
මානව සම්පත් කළමනාකරණය	26	39%

ප්‍රශ්න අංක 03 (ඒකකය - ව්‍යාපාර පදනම)

මෙම ප්‍රශ්නයෙහි නිවැරදි පිළිතුර වන තෙවන වරණය තෝරා ගෙන ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 49%ක් පමණි. 28%ක් 5 වන වරණය හා 18%ක් 4 වන වරණය තෝරා ගෙන ඇත. මෙසේ අපේක්ෂකයන් වැඩි පිරිසක් වැරදි වරණ තෝරා ගැනීමට හේතු වනුයේ එම ප්‍රශ්නය හොඳින් කියවා අවබෝධ කරගෙන නොමැති වීම හා සංකල්ප පිළිබඳව ඇති අනවබෝධය යි. එහෙයින් ප්‍රශ්නය හොඳින් කියවා අවබෝධ කර ගැනීමෙන් අනතුරුව පිළිතුරු සැපයීමට අපේක්ෂකයින්ට පුරුදු පුහුණු කළ යුතු අතර විෂයානුබද්ධ සංකල්ප පිළිබඳව අවධානය යොමු කිරීමට ඔවුන් පෙළඹවිය යුතුය.

ප්‍රශ්න අංක 05 (ඒකකය - ව්‍යාපාර පදනම)

මෙම ප්‍රශ්නයෙහි නිවැරදි පිළිතුර වන හතරවන වරණය තෝරා ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 30%ක් පමණි. 32%ක් තෙවන වරණය තෝරා ගෙන තිබුණි. මෙසේ වැඩි පිරිසක් වැරදි වරණ තෝරා ගැනීමට හේතුව වනුයේ අදාළ සිද්ධිය හොඳින් අධ්‍යයනය කර සිද්ධියට අදාළව පිළිතුරු සපයා නොතිබීමයි. සිද්ධියක් දුන් විට එම සිද්ධිය හොඳින් කියවා සිද්ධිය ඇසුරින් පිළිතුරු සැපයීමට අපේක්ෂකයින් පුරුදු පුහුණු කිරීමට ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතුය.

ප්‍රශ්න අංක 20 (ඒකකය - වෙළෙඳාම)

මෙම ප්‍රශ්නයෙහි නිවැරදි පිළිතුර වන තෙවන වරණය තෝරා ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 46%ක් පමණි. වැඩි පිරිසක් වැරදි වරණ තේරීමට හේතුව වනුයේ මංගත ක්‍රමයට භාණ්ඩ මිලදීගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධ ප්‍රායෝගික දැනුමක් නොමැති වීමයි. ඒ සම්බන්ධව ප්‍රායෝගික අත්දැකීම් ලබාගැනීමට අපේක්ෂකයින් යොමු කළ යුතුය. වෙළෙඳාමේදී භාවිත වන නව තාක්ෂණ ක්‍රම පිළිබඳව අපේක්ෂකයින්ගේ නිරන්තර අවධානය යොමු විය යුතුය.

ප්‍රශ්න අංක 26 (ඒකකය - මානව සම්පත් කළමනාකරණය)

මෙම ප්‍රශ්නයෙහි නිවැරදි පිළිතුර වන දෙවන වරණය තෝරා ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 39%ක් පමණි. 31%ක් තෝරා ඇත්තේ තෙවන වරණය යි. වැඩි පිරිසක් වැරදි වරණයන් තෝරා ගැනීමට හේතුව වනුයේ නායකත්ව නිපුණතාව ප්‍රගුණ කිරීමට අදාළ පුහුණු ක්‍රමය පිළිබඳව අපේක්ෂකයින් අවබෝධ කරගෙන නොමැති වීමයි. එබැවින් ප්‍රශ්නය හොඳින් කියවා නිවැරදි පිළිතුරට යොමු වීමට අපේක්ෂකයින් පුරුදු පුහුණු කළ යුතුය.

2.1.7 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න අංක 31 සිට 50 දක්වා ප්‍රශ්න, අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

- අංක 31 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

31. (අ) වෙළෙඳපොළ .... මෙන්ම... ක්‍රම හරහා ද නිර්මාණය වේ.

(ආ) පාරිභෝගිකයා විසින් භාණ්ඩයේ මිල, ගුණත්වය හා මෝස්තරය සැසඳීමෙන් පසුව මිල දී ගන්නේ .... භාණ්ඩ වන අතර, විශේෂිත ප්‍රයත්නයකින් තොර ව නිරන්තරයෙන් මිල දී ගන්නේ .... භාණ්ඩ වේ.

පිළිතුරු

(අ) භෞතික/ ස්ථාන, විද්‍යුත් / අවකාශ **(අනුපිළිවෙළින්)**

(ආ) සාප්පු, පහසු **(අනුපිළිවෙළින්)**

32. (අ) ආයතනයක අයිතිකරුවන්, කළමනාකරුවන් හා සේවකයින්ගේ විශ්වාස, වටිනාකම්, ආකල්ප යනාදිය මත සංවිධානයේ .... සකස් වේ.

(ආ) රජයට අවශ්‍ය කෙටි කාලීන ණය සපයා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් .... නිකුත් කරන අතර, මධ්‍ය හා දිගු කාලීන ණය සපයා ගැනීම සඳහා .... නිකුත් කෙරේ .

පිළිතුරු

(අ) සංස්කෘතිය

(ආ) භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර **(අනුපිළිවෙළින්)**

33. (අ) හවුල් ව්‍යාපාරයක් ලිඛිතව හෝ .... හෝ .... හෝ ඇති කරගත හැකිය.

(ආ) සමාගම් විසින්, තම .... මත මෙන් ම කොටස්කරුවන්ට හිමි වන .... මත ද ආදායම් බදු ගෙවීම ද්විත්ව බදුකරණය (Double Taxation) නමින් හැඳින්වේ.

පිළිතුරු

(අ) වාචිකව, ඇඟවීමෙන් / හැසිරීමෙන් / ව්‍යංගයෙන් **(අනුපිළිවෙළින්)**

(ආ) මුළු ලාභය, ශුද්ධ ලාභය / ලාභය, ලාභාංශ **(අනුපිළිවෙළින්)**

34. (අ) පහත දැක්වෙන එක් එක් ප්‍රකාශ **සත්‍ය** හෝ **අසත්‍ය** බව සඳහන් කරන්න.

ප්‍රකාශය	සත්‍ය / අසත්‍ය
1. කේවල ස්වාමි ව්‍යාපාරයක් තම නමින් ආදායම් බදු ගෙවනු ලැබේ	:................................
2. අවදානම් දැරීම ව්‍යවසායකත්වයේ ලක්ෂණයකි.	:................................
3. දත්ත හා තොරතුරු අතර වෙනසක් නැත.	:................................
4. මුළු නිෂ්පාදන පිරිවැය, නිෂ්පාදන ඒකක ගණනින් බෙදීමෙන් ඒකකයක නිෂ්පාදන පිරිවැය ගණනය කළ හැකිය	:................................

පිළිතුරු

(අ) 1. අසත්‍ය
2. සත්‍ය
3. අසත්‍ය
4. සත්‍ය

} **පිළිතුරු වචනයෙන්ම අපේක්ෂා කෙරේ.**

35. (අ) ජංගම ගිණුම් හිමියා, චෙක්පතක .... වන අතර, චෙක්පතේ නම සඳහන් පුද්ගලයා .... වේ.

(ආ) කෙටි කාලීන (තාවකාලික) බැංකු අයිරා පහසුකම් .... ඇප මත ලබා ගත හැකි අතර, දිගු කාලීන (ස්ථාවර) බැංකු අයිරා පහසුකම් .... ඇප මත ලබාගත හැකි වේ.

පිළිතුරු

(අ) අණකරු, ආදායකයා

(ආ) පුද්ගල, දේපල

36. (අ) මූල්‍ය ආයතන වර්ගීකරණය අනුව සේවක භාරකාර අරමුදල .... ඉතිරි කිරීමේ ආයතනයක් වන අතර, ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම් .... මූල්‍ය ආයතන වේ.

(ආ) විද්‍යුත් ගණුදෙණුවක් සිදු කිරීමේ දී එයට සම්බන්ධ වන පාර්ශවකරුවන් වන්නේ කාඩ්පත් හිමියා, වෙළෙන්දා, ... හා .... වේ.

පිළිතුරු

(අ) ගිවිසුම්ගත, අනෙකුත් විශේෂිත **(අනුපිළිවෙළින්)**

(ආ) ණයපත් සංගමය, ණයපත් නිකුත් කරන ආයතනය/ බැංකුව

37. (අ) මෝටර් රථය හා එහි ගමන් කරන මගීන්ට, බාහිර පාර්ශවයන්ට හා සියලු ම දේපළවලට සිදුවන හානි සඳහා ආවරණය ලබා ගැනීමට හැකි වන්නේ .... රක්ෂණ ඔප්පුව මඟින් වන අතර, බාහිර පාර්ශවයන්ට හා දේපළවලට සිදුවන හානි සඳහා පමණක් ආවරණය ලබා ගත හැකි වන්නේ .... රක්ෂණ ඔප්පුව මගිනි.

(ආ) නිෂ්පාදකයකු, තම භාණ්ඩ තමා විසින්ම අපනයනය කිරීම .... ක්‍රමය ලෙස ද, බාහිර පාර්ශවයක් මගින් අපනයනය කිරීම .... ක්‍රමය ලෙස ද හඳුන්වයි.

පිළිතුරු

(අ) විස්තීර්ණ/ සම්පූර්ණ වගකීම් සහිත, අවම තෙවන පක්ෂ/ පූර්ණ **(අනුපිළිවෙළින්)**

(ආ) ඍජු, නියෝජිත/ ඉන්ඩෙන්ට්/ වක්‍ර **(අනුපිළිවෙළින්)**

38. (අ) බුද්ධිමය දේපළ හිමිකම් පනත යටතේ, ග්‍රන්ථ සඳහා නීතිමය වශයෙන් ලැබෙන අයිතිය .... වන අතර, නවෝත්පාදන සඳහා ලැබෙන තාවකාලික ඒකාධිකාරී නීතිමය අයිතිය .... වේ.

(ආ) ව්‍යාපාරයක විවිධ භාණ්ඩ සඳහා විවිධ සන්නම් නාම භාවිත කිරීම .... සන්නම වන අතර, එකම සන්නම යටතේ භාණ්ඩ පෙළක් ඉදිරිපත් කිරීම .... සන්නම වේ.

පිළිතුරු

(අ) ලිපි හිමිකම/ ප්‍රකාශන අයිතිය, පේටන්ට් බලපත්‍රය/ ස්වාධිකාරය/ කතෘ හිමිකම **(අනුපිළිවෙළින්)**

(ආ) භාණ්ඩ, පවුල් **(අනුපිළිවෙළින්)**

39. (අ) තමා විසින්ම තීරණ ගෙන අනුගාමිකයින් ලවා ක්‍රියාත්මක කරවන්නේ .... නායකත්වය වන අතර, පොදු එකඟත්වය මත තීරණ ගෙන අනුගාමිකයින් ලවා ක්‍රියාත්මක කරවන්නේ .... නායකත්වය වේ.

(ආ) ආයතනයක කළමනාකරුවෙකුට ඔහුගේ දැනුම හා කුසලතා මත .... බලය හිමි වන අතර, සේවකයන් වෙත ප්‍රසාද දීමනා ලබා දීමට හැකි වන්නේ .... බලය මත වේ.

පිළිතුරු

(අ) ඒකාධිපති, ප්‍රජාතන්ත්‍රවාදී **(අනුපිළිවෙළින්)**

(ආ) විශේෂඥ, තෑගි දීමේ/ ප්‍රදානයන් දීම **(අනුපිළිවෙළින්)**

40. ව්‍යාපාර ආයතනයකට අදාළ, පහත දැක්වෙන එක් එක් ක්‍රියාකාරකම සඳහා ගැළපෙන මානව සම්පත් කළමනාකරණ ශ්‍රිතයට අයත් කාර්යය හිස්තැන මත ලියන්න.

ක්‍රියාකාරකම	මානව සම්පත් කළමනාකරණ කාර්යය
1. නව සේවකයන් බඳවා ගැනීම සඳහා පුවත්පත් දැන්වීමක් පළ කිරීම	:.........................
2. අයදුම්කරුවන්ගේ සාමාන්‍ය දැනුම ඇගයීම සඳහා ලිඛිත පරීක්ෂණයක් පැවැත්වීම	:.........................
3. නව සේවකයකු රැකියාවේ නියුක්ත කිරීම තුළින් ම රැකියාවේ කාර්යයන් ඉගෙනීම	:.........................
4. සේවක ඵල ඇගයීම සඳහා ලකුණු ක්‍රමයක් හඳුන්වා දීම	:.........................

පිළිතුරු

(අ) (1) සේවක ආකර්ෂණය
(2) තෝරා ගැනීම
(3) පුහුණුව/ රැකියාව තුළ පුහුණුව/ පුහුණුව හා සංවර්ධනය
(4) කාර්යඵල ඇගයීම/ කාර්ය සාධන ඇගයීම

- අංක **41** සිට **50** තෙක් ප්‍රශ්නවලට **නිශ්චිත පිළිතුරු** සපයන්න.

41. ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ සිට අවසානය දක්වා විවිධ උපකාරක සේවා අවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ එම සේවා සපයන රාජ්‍ය පරිපාලන ව්‍යුහ මට්ටම් **හතරක්** නම් කරන්න.

1. ....
2. ....
3. ....
4. ....

පිළිතුරු

1. මධ්‍යම රජය
2. පළාත් සභා

3 හා 4 සඳහා පළාත් පාලන ආයතන, මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා යන පිළිතුරුවලින් ඕනෑම දෙකක්

42. ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර වෙළෙඳපොළ සමීක්ෂණය කිරීමේ දී සැලකිය යුතු ප්‍රධාන කරුණු **හතරක්** ලියන්න.

1. ....
2. ....
3. ....
4. ....

පිළිතුරු

- ගනුදෙනුකරුවන් පිළිබඳව/ පාරිභෝගික ඉල්ලුම
- තරගකරුවන් පිළිබඳව
- සමාජ හා සංස්කෘතික සාධක පිළිබඳව
- ආවරණ ප්‍රදේශය/ ඉලක්ක වෙළෙඳපොළ පිළිබඳව
- නිෂ්පාදිත වර්ග පිළිබඳව
- මිල

43. සැපයුම්කරුවන්, ව්‍යාපාරයකට තර්ජනයක් විය හැකි ආකාර **හතරක්** ලියන්න.

1. ....
2. ....
3. ....
4. ....

පිළිතුරු

- කලට වේලාවට ද්‍රව්‍ය නොසැපයීම/ භාණ්ඩ ණයට නොදීම
- ගුණාත්මක බවින් අඩු ද්‍රව්‍ය ලබා දීම
- අසාධාරණ කොන්දේසි පැනවීම
- ද්‍රව්‍ය මිල ගණන් කේවල් කිරීම
- අඛණ්ඩව ද්‍රව්‍ය ලබා නොදීම/ ප්‍රමාණවත් ලෙස භාණ්ඩ ලබා නොදීම
- සැපයුම්කරුවන්ගේ සාමූහික ශක්තිය/ සැපයුම්කරුවන්ගේ වෘත්තීය සමිති

44. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ප්‍රමිති ක්‍රියාත්මක කරන ආකාර **හතරක්** සඳහන් කරන්න.

1. ....
2. ....
3. ....
4. ....

පිළිතුරු

- ස්වේච්ඡාවෙන්
- SLS සහතික ලාංඡන ක්‍රමය මගින්
- පූර්ව අපනයන පරීක්ෂාව මගින්
- ආනයන පරීක්ෂාව මගින්
- සහතික නිකුත් කිරීම මගින්
- මුහුදු ආහාර අපනයන පරීක්ෂාව මගින්

45. සැලසුම් සකස් කිරීමේ මූලධර්ම **හතරක්** ලියන්න.

1. ....
2. ....
3. ....
4. ....

පිළිතුරු

- අරමුණු හා පරමාර්ථ මත පදනම් වීම
- ප්‍රායෝගික වීම
- නම්‍යශීලී බව
- තේරුම් ගැනීම පහසු වීම/ සරල බව

- නිශ්චිත කාල සීමාවක් තිබීම
- සෙසු කළමනාකරණ කාර්යයන්ට පෙර සැකසීම/ සෙසු කළමනාකරණ කාර්යයන් සමඟ සම්බන්ධතාවක් පැවතීම
- සෑම මට්ටමකම කළමනාකරුවන් සහභාගී කරවා ගැනීම

46. උපරිම තොග මට්ටම ගණනය කිරීමේ දී සැලකිල්ලට ගත යුතු සාධක **හතරක්** ලියන්න.

1. ....
2. ....
3. ....
4. ....

පිළිතුරු
- යළි ඇනවුම් මට්ටම
- අවම තොග භාවිතය/ අවම තොග පාරිභෝජනය
- අවම ඇණවුම් කාලය
- යළි ඇණවුම් ප්‍රමාණය/ ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ)

47. පහත දැක්වෙන සංකේත මගින් හඳුන්වනු ලබන්නේ කුමක් ද?



1. ලියාපදිංචි වෙළෙඳ ලකුණ/ වෙළෙඳ ලකුණ
2. යුරෝ මුදල
3. සාර්ක් සංවිධානය (SAARC)
4. ලෝක බැංකුව

48. පාරිභෝගික දෘෂ්ටියෙන් සලකා බලන විට අලෙවිකරණ මිශ්‍රය තුළ ඇතුළත් වන විචල්‍ය **හතර** සඳහන් කරන්න.

1. ....
2. ....
3. ....
4. ....

පිළිතුරු
1. පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා
2. පිරිවැය
3. පහසුව
4. සන්නිවේදනය

49. තොරතුරු පද්ධතියක ප්‍රධාන කාර්යය **හතර** ලියන්න.

1. ....
2. ....
3. ....
4. ....

පිළිතුරු

- ආදානය/ යෙදවුම්
- සැකසීම/ ක්‍රියාවලිය
- ප්‍රතිදානය/ නිමැවුම
- ගබඩා කිරීම


50. මූල්‍ය සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතා **හතරක්** ලියන්න.

1. ....
2. ....
3. ....
4. ....

පිළිතුරු

- අවශ්‍ය අරමුදල් ප්‍රමාණය නිගමනයට හා සම්පාදනයට
- අරමුදල් ආයෝජන තීරණයට
- අරමුදල් ඌණතාවයක් හඳුනාගෙන පිළියම් යෙදීමට
- අතිරික්ත අරමුදල් ඵලදායීව යෙදීම

2.1.8 I ප්‍රශ්න පත්‍රයේ අංක **31 - 50** තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ



ප්‍රස්තාරය 06

2.1.9 I ප්‍රශ්න පත්‍රයේ අංක 31 - 50 තෙක් ප්‍රශ්න සඳහා ලකුණු ලබා ඇති ආකාරය

ප්‍රශ්න අංකය	ලකුණු ලබාගත් ප්‍රතිශතය					
	ලකුණු 0	ලකුණු 0.5	ලකුණු 1	ලකුණු 1.5	ලකුණු 2	ප්‍රතිචාර නොදැක්වූ
31	12%	12%	30%	14%	31%	-
32	28%	8%	32%	4%	27%	1%
33	6%	13%	23%	27%	30%	1%
34	1%	1%	7%	35%	56%	-
35	17%	23%	42%	11%	6%	1%
36	15%	32%	22%	18%	11%	2%
37	13%	11%	25%	22%	29%	1%
38	20%	19%	22%	17%	20%	2%
39	28%	14%	33%	16%	6%	2%
40	26%	18%	18%	22%	12%	3%
41	73%	5%	6%	4%	8%	4%
42	21%	24%	32%	18%	4%	2%
43	12%	10%	23%	29%	23%	2%
44	53%	13%	9%	8%	13%	5%
45	46%	10%	10%	13%	18%	4%
46	34%	14%	17%	14%	16%	3%
47	37%	30%	19%	9%	3%	2%
48	42%	6%	6%	11%	32%	3%
49	40%	10%	6%	11%	31%	2%
50	48%	23%	17%	7%	3%	3%

වගුව **07**

* I පත්‍රයේ ප්‍රශ්න අංක 31 සිට 50 දක්වා ප්‍රශ්නවලට ලකුණු ලබාගත් ප්‍රතිශතය ලකුණු 0, ලකුණු 0.5, ලකුණු 01, ලකුණු 1.5 හා ලකුණු 02 තීරුවලින් දැක්වේ.

* ''ප්‍රතිචාර නොදැක්වූ'' යනුවෙන් දක්වා ඇත්තේ ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා නොමැති අයදුම්කරුවන්ගේ ප්‍රතිශතයයි.

  උදා :- අයදුම්කරුවන්ගෙන් 56%ක් ප්‍රශ්න අංක 34 සඳහා වැඩිම ලකුණු ලබාගෙන ඇති අතර, අයදුම්කරුවන්ගෙන් අඩු ම ප්‍රතිශතයක් එනම් 3%ක් අඩුම ලකුණු ලබාගෙන ඇති ප්‍රශ්න වන්නේ ප්‍රශ්න අංක 47 සහ 50 වේ.

2.1.10 I ප්‍රශ්න පත්‍රයේ අංක 31 - 50 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිගමන හා යෝජනා

31 සිට 50 දක්වා වූ පිළිතුරු සැපයීමේ ප්‍රශ්න සැලකූ විට ප්‍රශ්න අංක 39, 41, 42, 44, 45, 46, 47, 50 යන ප්‍රශ්නවල පහසුතාව 40%ට වඩා අඩුය.

ප්‍රශ්න අංක 39 (ඒකකය - කළමනාකරණය)

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන්ගෙන් 28%ක්ම කිසිදු ලකුණක් ලබා ගෙන නොමැත. සම්පූර්ණ ලකුණු ලබාගෙන ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 6%ක් පමණි. මෙයට හේතුව වන්නේ නායකත්ව ශෛලීන් මෙන්ම කළමනාකරුවෙකුට නායකයෙකු වශයෙන් කටයුතු කිරීමට බලය ලැබෙන විවිධ ආකාර පිළිබඳව අපේක්ෂකයන් තුළ නිවැරදි අවබෝධයක් නොමැති වීමයි. ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේදී මෙම කරුණු පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ යුතු වේ.

ප්‍රශ්න අංක 41 (ඒකකය - රජය හා ව්‍යාපාර)

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන්ගෙන් 73%ක්ම කිසිදු ලකුණක් ලබා ගෙන නොමැත. සම්පූර්ණ ලකුණු ලබාගෙන ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 8%ක් පමණි. මෙසේ අඩු පහසුතාවයක් ඇති වීමට හේතුව වන්නේ ප්‍රශ්නය නිවැරදි ව අවබෝධ කරගෙන නොමැති වීම නිසා රාජ්‍ය පරිපාලන ව්‍යුහ මට්ටම් හතරම නිවැරදි ව නම් කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වීමයි. එම නිසා ව්‍යාපාර සඳහා උපකාරක සේවා සපයන රාජ්‍ය පරිපාලන ව්‍යුහයන් පිළිබඳව ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේදී න්‍යායාත්මකව හා ප්‍රායෝගිකව අවබෝධ කර දිය යුතුය.

ප්‍රශ්න අංක 42 (ඒකකය - අලෙවි කළමනාකරණය)

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන්ගෙන් 21%ක්ම කිසිදු ලකුණක් ලබා ගෙන නොමැත. සම්පූර්ණ ලකුණු ලබාගෙන ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 4%ක් පමණි. මෙසේ පහසුතාව අඩු වීමට හේතුව වන්නේ අපේක්ෂකයන් ප්‍රශ්නයේ හරය වන ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර වෙළෙඳපොළ සමීක්ෂණය කිරීමේ දී සැළකිය යුතු ප්‍රධාන කරුණු පිළිබඳව මනාව අවබෝධ කරගෙන නොමැති වීමයි. සම්ප්‍රදායික පිළිතුරු සැපයීමෙන් බැහැරව අලෙවිකරණ අවස්ථාවන් හඳුනාගැනීමේ සිට පාරිභෝගික තෘප්තිය හඳුනා ගැනීම දක්වා විවිධ අදියරයන්හි දී වෙළෙඳපොළ සමීක්ෂණයක් කිරීම පිළිබඳ අපේක්ෂකයින්ට දැනුම ලබා දිය යුතුය .

ප්‍රශ්න අංක 44 (ඒකකය - රජය හා ව්‍යාපාර)

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන්ගෙන් 53%ක්ම කිසිදු ලකුණක් ලබා ගෙන නොමැත. සම්පූර්ණ ලකුණු ලබාගෙන ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 13%ක් පමණි. 5%ක් ප්‍රතිචාර දක්වා නොමැත. පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධව ඍජුවම කටයුතු කරන අයතනවල කාර්යයන් පිළිබඳව අපේක්ෂකයන් තුළ අවබෝධයක් නොමැතිවීම මීට හේතුවයි. මෙම ආයතන හා ඒවායේ කාර්යයන් පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුම හා අවබෝධය ඉහළ නැංවීමට ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේදී අවධානය යොමු කළ යුතුය.

ප්‍රශ්න අංක 45 (කළමනාකරණය)

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන්ගෙන් 46%ක්ම කිසිදු ලකුණක් ලබා ගෙන නොමැත. සම්පූර්ණ ලකුණු ලබාගෙන ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 18%ක් පමණි. මෙවැනි අඩු සාධන තත්ත්වයක් ඇති වීමට හේතුව වන්නේ සැලසුම්කරණය පිළිබඳව අපේක්ෂකයන් තුළ අවබෝධයක් නොමැති වීමයි. ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේදී සැලසුම්කරණ ශ්‍රිතය පිළිබඳ පුළුල් අවබෝධයක් අපේක්ෂකයන්ට ලබා දිය යුතුය.

ප්‍රශ්න අංක 46 (මෙහෙයුම් කළමනාකරණය)

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන්ගෙන් 34%ක්ම කිසිදු ලකුණක් ලබා ගෙන නොමැත. සම්පූර්ණ ලකුණු ලබාගෙන ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 16%ක් පමණි. උපරිම තොග මට්ටම ගණනය කරනු ලබන සමීකරණය දැන සිටියද ගණනය කිරීමේ දී සැලකිල්ලට ගතයුතු සාධක එම සමීකරණය තුළ ඇතුළත් බව අපේක්ෂකයන් තුළ අවබෝධයක් නොමැතිවීම මෙයට හේතුවයි. තොග මට්ටම් ගණනය කිරීමට මෙන්ම එම ගණනය කිරීම සඳහා භාවිත කරනු ලබන සමීකරණයන්හි ඇතුළත් සාධක පිළිබඳව පන්ති කාමරය තුළදී අපේක්ෂකයන්ට මඟ පෙන්වීම වැදගත් වේ.

ප්‍රශ්න අංක 47 (වෙළෙඳාම)

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන්ගෙන් 37%ක්ම කිසිදු ලකුණක් ලබා ගෙන නොමැත. සම්පූර්ණ ලකුණු ලබාගෙන ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 36%ක් පමණි. මෙයට හේතුව වී ඇත්තේ ව්‍යාපාර විෂය ක්ෂේත්‍රය හා සබැඳි සම්මත සංකේත පිළිබඳව අපේක්ෂකයන් තුළ ඇති දැනුම පහළ මට්ටමක පැවතීමයි. දේශීය හා විදේශීය ආයතන හා සංවිධාන විසින් භාවිත කරනු ලබන ජාත්‍යන්තරව පිළිගත් සංඥා හා සංකේත පිළිබඳව දැනුම තහවුරු වන ලෙස පන්ති කාමරය තුළ විවිධ ප්‍රදර්ශක භාවිත කිරීම තුළින් මෙම අවබෝධය තහවුරු කළ යුතුය.

ප්‍රශ්න අංක 50 (ව්‍යාපාර සැලැස්ම)

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන්ගෙන් 48%ක්ම කිසිදු ලකුණක් ලබා ගෙන නොමැත. සම්පූර්ණ ලකුණු ලබාගෙන ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 3%ක් පමණි. මෙසේ අඩු පහසුතාවයක් ඇති වීමට හේතුව වන්නේ මූල්‍ය සැලැස්මක් සකස්කිරීමේ අවශ්‍යතාව නිශ්චිතව දැක්වීමට අපේක්ෂකයන් අපොහොසත් වීමයි. ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේදී මූල්‍ය සැලැස්මක් ප්‍රායෝගිකව සකස් කිරීමට අපේක්ෂකයන් යොමු කිරීම සිදු කළ යුතුය.

2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 03 කි. මුළු ලකුණු 100 කි.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්තය.

I කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 4 කි.

II කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 4 කි.

- එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න 5කට පිළිතුරු සැපයිය යුතුය.

- එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් මුළු ලකුණු 100කි.

- ප්‍රශ්න පත්‍ර දෙක සඳහා අවසාන ලකුණු ගණනය කිරීම

I පත්‍රය සඳහා ලකුණු	=	100
II පත්‍රය සඳහා ලකුණු	=	100
අවසාන ලකුණු	=	200 / 2
	=	100

2.2.2 II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

II පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාර 2, 3, 4.1 හා 4.2 ඇසුරෙන් ඉදිරිපත් කර ඇත. ප්‍රශ්නයට අදාළ ප්‍රස්තාර කොටස ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමග දක්වා ඇත.

II පත්‍රය

1 ප්‍රශ්නය

I කොටස

1. (i) (අ) ව්‍යාපාරයක මූලික ශ්‍රිත (කාර්ය) **හතරක්** සඳහන් කරන්න.

(i) නිෂ්පාදන (මෙහෙයුම්)
(ii) මූල්‍ය/ ගිණුම්
(iii) අලෙවිකරණ
(iv) පරිපාලන
(v) මානව සම්පත්
(vi) පර්යේෂණ හා සංවර්ධන
(vii) කළමනාකරණ හා තොරතුරු පද්ධති

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 04කට ලකුණු 02යි)

(ආ) ගනුදෙනුකරුවන් හා තරගකරුවන් වෙන් වෙන් වශයෙන් ව්‍යාපාරයකට අවස්ථාවක් හා තර්ජනයක් වන්නේ කෙසේ දැයි දැක්වීම සඳහා උදාහරණය බැගින් ලියන්න.

ගනුදෙනුකරුවන්

අවස්ථා :

(i) ගනුදෙනුකරුවන් සංඛ්‍යාව වැඩිවීම
(ii) ගනුදෙනුකරුවන්ගේ වැය කළ හැකි ආදායම ඉහළ යාම
(iii) ගනුදෙනුකරුවන්ගේ ජීවන රටාවේ වෙනස්වීම
(iv) ගනුදෙනුකරුවන්ගේ සංවිධාන ශක්තිය අඩුවීම
(v) භාණ්ඩ අතර විතැන් වීමේ වියදම වැඩිවීම/ ආදේශන භාණ්ඩ නොමැති වීම
(vi) ගනුදෙනුකරුවන්ගේ භාණ්ඩ හා වෙළෙඳපොළ පිළිබඳ දැනුවත්භාවය අඩුවීම

(කරුණු 01කට ලකුණු 1/2යි)

තර්ජන :

(i) ගනුදෙනුකරුවන් සංඛ්‍යාව අඩුවීම
(ii) ගනුදෙනුකරුවන්ගේ වැය කළ හැකි ආදායම පහළ යාම
(iii) සීමිත ගනුදෙනුකරුවන් සංඛ්‍යාවක් විසින් වැඩිපුර ප්‍රමාණයක් මිළදී ගැනීම
(iv) ගනුදෙනුකරුවන්ගේ සංවිධාන ශක්තිය වැඩිවීම
(v) භාණ්ඩ අතර විතැන් වීමේ වියදම අඩුවීම/ ආදේශන භාණ්ඩ වැඩිවීම
(vi) ගනුදෙනුකරුවන්ගේ භාණ්ඩ හා වෙළෙඳපොළ පිළිබඳ දැනුවත්භාවය වැඩිවීම

(කරුණු 01කට ලකුණු 1/2යි)

තරගකරුවන්
අවස්ථා :

(i) තරගකරුවන්ගේ මූල්‍ය ශක්තිය අඩුවීම
(ii) තරගකරුවන්ගේ අලෙවි උපක්‍රම දුර්වල වීම
(iii) තරගකරුවන් වෙළෙඳපොළෙන් ඉවත් වීම
(iv) තරගකරුවන් පාරිභෝගිකයන් වෙනුවෙන් සපයන පහසුකම් හා සේවා අඩුවීම

(කරුණු 01කට ලකුණු 1/2යි)

තර්ජන :

(i) තරගකරුවන් අතර තරගකාරිත්වය ඉහළ යාම (සමාන මූල්‍ය ශක්තිය, අලෙවි උපක්‍රම වර්ධනය වීම ආදී)
(ii) තරගකරුවන් ගනුදෙනුකරුවන්ට වැඩි පහසුකම් හා සේවා සැපයීම
(iii) ආදේශක භාණ්ඩ වැඩි සංඛ්‍යාවක් වෙළෙඳපොළට පැමිණීම/ තරගකරුවන් වැඩි සංඛ්‍යාවක් වෙළෙඳපොළට පැමිණීම
(iv) වෙළෙඳපොළෙන් ඉවත් වීමට බාධා තිබීම

(කරුණු 01කට ලකුණු 1/2යි)

(ලකුණු 04යි)

(ii) (අ) ව්‍යාපාරිකයකු විසින් බැංකුවකින් ලබාගත් ණය මුදලක් ආපසු නොගෙවීම, බැංකුවට හා ව්‍යාපාරිකයාට බලපාන ආකාරය දක්වන්න.

බැංකුවට :

(i) පාඩු සිදුවීම
(ii) බැංකුවේ මූල්‍ය ශක්තිය අඩුවීම/ ණය දිමේ හැකියාව අඩුවීම/ කාරක ප්‍රාග්ධනය හිඟ වීම
(iii) ණය එකතු කර ගැනීමට අමතර පිරිවැයක් දැරිය යුතුවීම
(iv) බැංකුවේ ප්‍රතිරූපය බිඳ වැටීම

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 02කට ලකුණු 01යි)

ව්‍යාපාරිකයාට :

(i) විශ්වාසය පලුදු වීම
(ii) ව්‍යාපාරික ප්‍රතිරූපය බිඳ වැටීම
(iii) ව්‍යාපාරයට අනාගතයේ දී ණය මුදල් ලබා ගැනීම අපහසු වීම/ අසාදු ලේඛනගත වීම
(iv) ඇප සුරැකුම් අහිමි වීම
(v) විවිධ නඩු හා අලාභවලට මුහුණ දීමට සිදුවීම
(vi) ආයතනය පැවැත්ම අස්ථාවර වීම

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 02කට ලකුණු 01යි)

(ආ) සංවිධාන සංස්කෘතිය තුළ ඇති ශක්තියක් හා දුර්වලතාවයක් සඳහා උදාහරණය බැගින් දක්වා, පැහැදිලි කරන්න.

ශක්තීන් :

(i) පක්ෂපාතී සේවකයන් බිහිවීම
(ii) ආයතනය තුළ සාමූහිකත්වය ඇතිවීම/ මනා සේව්‍ය සේවක සම්බන්ධතා
(iii) සමාජ අනන්‍යතාවයක් ඇතිවීම
(iv) සේවකයන්ගේ හැසිරීම ආයතනයේ සංස්කෘතියට අනුකූල වීම

(එක් කරුණකට ලකුණු 01යි)

දුර්වලතා :

(i) සේව්‍ය - සේවක මත ගැටුම් ඇතිවීම
(ii) පුද්ගල සිතීම් හා හැසිරීම් සංස්කෘතික රාමුවට කොටුවීම
(iii) උප සංස්කෘතීන් බිහි වීමට ඉඩ තිබීම
(iv) සංස්කෘතියේ නොගැළපීම් නිසා සේවක කාර්ය සාධන විවිධත්වයක් ඇතිවිය හැක

(එක් කරුණකට ලකුණු 01යි)

(ලකුණු 04යි)

(iii) පහත දක්වා ඇති සාර්ව පාරිසරික සාධක අතර පවතින අන්තර් සම්බන්ධතාව එක් උදාහරණයක් බැගින් දක්වමින් කෙටියෙන් පැහැදිලි කරන්න.

(අ) **ස්වභාවික පරිසරය - සමාජයීය හා සංස්කෘතික පරිසරය**

ස්වාභාවික පරිසරය මගින් සමාජ හා සංස්කෘතික පරිසරයට බලපෑම් කරන ආකාරය හෝ සමාජ සංස්කෘතික කටයුතු මත ස්වභාවික පරිසරයට බලපෑම් සිදුවන ආකාරය උදාහරණයක් මගින් පැහැදිලි කිරීමට

(ලකුණු 02යි)

(උදාහරණ නැත්නම් ලකුණු 01යි)

(ආ) **දේශපාලන පරිසරය - ආර්ථික පරිසරය**

දේශපාලන පරිසරය හා ආර්ථික පරිසරය අතර අන්තර් සම්බන්ධතාව උදාහරණයක් මගින් පැහැදිලි කිරීමට

(ලකුණු 02යි)

(උදාහරණ නැත්නම් ලකුණු 01යි)

(iv) (අ) සේවකයින්ගේ දෘෂ්ටියෙන් බලන විට සේව්‍ය පාර්ශවය විසින් සේවකයින්ට සිය වගකීම් ඉටු නොකළේ යැයි සැළකිය හැකි අවස්ථා **දෙකක්** සඳහන් කරන්න.

(i) වැඩ බෙදීම හා කාර්යයන් පැවරීමේ දී
(ii) උසස් වීම් ලබා දීමේ දී
(iii) වැටුප් තල සකස් කිරීමේ දී
(iv) පුහුණුව සංවර්ධනයට තෝරා ගැනීමේ දී
(v) කාර්යඵල ඇගයීමේ දී
(vi) සේවකයින් ස්ථිර කිරීමේ දී
(vii) සේවක සුබසාධන කටයුතුවල දී
(viii) මාරු කිරීමේ දී
(ix) බඳවා ගැනීමේ දී
(x) සේවක දුක් ගැනවිලි නිරාකරණයේ දී
(xi) ඉවත් කිරීමේ දී
(xii) සේවක විනය සම්බන්ධ තීරණ ගැනීමේ දී

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02කට ලකුණු 02යි)

(ආ) බස් රථයක ගමන් කරන මගියෙකු හා කොන්දොස්තර මහතකු විසින් පිළිපැදිය යුතු යැයි පොදුවේ පිළිගත් ආචාර ධර්ම **දෙක** බැගින් ලියන්න.

මගියා :

(i) නියමිත මුදල ගෙවා ප්‍රවේශ පත්‍රයක් ලබා ගැනීම
(ii) බසය තුළ විනීතව හැසිරීම
(iii) පූජ්‍ය පක්ෂයට, ආබාධිත, ගර්භණී මාතාවන්ට, වැඩිහිටියන්ට උදව් කිරීම සහ ආසන පිරිනැමීම
(iv) බස් රථයට හානි නොකිරීම

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 02කට ලකුණු 01යි)

කොන්දොස්තර මහතා :

(i) විනීතව කථා කිරීම
(ii) නියමිත පරිදි ඉතිරි මුදල් ගෙවීම
(iii) අවශ්‍ය අයට උදව් කිරීම
(iv) බස් රථය පිරිසිදුව පවත්වාගෙන යාම


(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 02කට ලකුණු 01යි)

(v) ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන බෝගයක් වන තේ කර්මාන්තයෙන් ආර්ථිකයට ලැබෙන දායකත්වය ක්‍රම ක්‍රමයෙන් අඩු වීමට බලපා ඇති ප්‍රධාන හේතු **දෙකක්** විස්තර කරන්න.

(i) අඛණ්ඩව පැවති අයහපත් කාලගුණය
(ii) තේ නිෂ්පාදනයට යොමු වී සිට සේවකයින් හා ආයෝජකයින් කර්මාන්තයෙන් ඉවත් වීම
(iii) තේ වෙනුවට ආදේශක බිහි වීම නිසා තේ සඳහා ඉල්ලුම අඩුවීම
(iv) සමහර රටවලට බලපෑ විවිධ හේතු නිසා විදේශ රටවලින් තේ සඳහා ඇති ඉල්ලුම අඩුවීම
(v) තේ කර්මාන්තකරුවන්ගේ මූල්‍ය හා වෙනත් අර්බුද
(vi) නිෂ්පාදන පිරිවැය වැඩිවීම
(vii) ඵලදාව අඩුවීම
(viii) රජයේ අනුග්‍රහය
(ix) වෙනත් තරගකරුවන්ගේ (රටවල) බලපෑම
(x) සේවක කාර්යක්ෂමතාව අඩුවීම

(පැහැදිලි කිරීම් සහිත හේතු 02කට ලකුණු 04යි)
(පැහැදිලි කිරීම් නැතිනම් එක් හේතුවකට ලකුණු 01 බැගින් හේතු 02ට ලකුණු 02යි)
(මුළු ලකුණු 20යි)


1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා



II ප්‍රශ්න පත්‍රයෙහි I කොටසින් වැඩිම සිසුන් පිරිසක් තෝරාගත් ප්‍රශ්නය මෙයයි. 1 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 99%කි. (ප්‍රස්තාරය 02) මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 7%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 31%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 42%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 20%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 62%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 38%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට අයත් කොටස් සහ අනුකොටස් 10 අතුරෙන් පහසුතාව වැඩිම අනුකොටස (iv) (ආ) වන අතර එහි පහසුතාව 78%කි. එසේම පහසුතාව අඩුම අනුකොටස වන්නේ (iii) (අ) වන අතර එහි පහසුතාව 39%ක් බවත් සෙසු ප්‍රශ්න කොටස්වල පහසුතාව පිළිබඳවත් මෙම ප්‍රස්තාරයෙන් පැහැදිලි වේ.

පළමුවන ප්‍රශ්නයේ (ii) (ආ) අනුකොටසෙහි පහසුතාව 46%කි. මෙසේ පහසුතාව පහළ යාමට හේතුව වන්නේ අපේක්ෂකයින් ප්‍රශ්නය නිවැරදිව තේරුම් නොගැනීමයි. එනම් සංවිධාන සංස්කෘතිය තුළ ඇති ශක්තීන් හා දුර්වලතා අපේක්ෂකයින් නිවැරදිව අවබෝධ කරගෙන නැත. අපේක්ෂකයින් ප්‍රශ්නය හොඳින් කියවා එහි අන්තර්ගතය තේරුම් ගැනීමට යොමු විය යුතුයි. සංවිධාන සංස්කෘතිය තුළ ඇති විවිධ මූලිකාංග මොනවා ද යන්න නිවැරදිව අවබෝධ කරගත යුතු අතර, ඒ ඒ මූලිකාංග ශක්තීන් හා දුර්වලතා හැටියට ක්‍රියාත්මක වන ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කළ යුතුය. මේ සඳහා ලිඛිත පැවරුම් භාවිත කළ හැකිය.

පළමුවන ප්‍රශ්නයේ (iii) (අ) අනුකොටසෙහි පහසුතාව 39%කි. මෙම කොටසෙහි පහසුතාව අඩු වීමට හේතුව ස්වභාවික පරිසරය හා සමාජයීය හා සංස්කෘතික පරිසරය අතර ඇති අන්තර් සම්බන්ධතාව පිළිබඳව අපේක්ෂකයින් තුළ නිරවුල් අවබෝධයක් නොමැති වීමයි. ස්වභාවික පරිසරයේ පැවැත්ම රඳා පවතින්නේ සමාජ හා සංස්කෘතික පරිසරය මත බව ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේදී උදාහරණ සහිතව පැහැදිලි කළ යුතු වේ.

2 ප්‍රශ්නය

2. (i) (අ) "රජයක් විසින් විවිධාකාරයේ බදු පනවනු ලබයි." මෙසේ බදු පැනවීම, ව්‍යාපාර කෙරෙහි බලපාන අකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(i) භාණ්ඩ හා සේවා මිල වැඩිවීම නිසා ඉල්ලුම අඩුවීම
(ii) යෙදවුම් මිල ඉහළ යාම නිසා නිෂ්පාදන පිරිවැය ඉහළ යාම
(iii) විකුණුම් ආදායම අඩුවීම නිසා ලාභ අඩුවීම
(iv) ප්‍රතිආයෝජනය අඩුවීම
(v) බදු පැනවීම නිසා සමහර කර්මාන්ත ආරක්ෂා වීම
(vi) යටිතල පහසුකම් වර්ධනය කිරීමට හැකිවීම

(එක් පැහැදිලි කිරීමකට ලකුණු 1/2 බැගින් කරුණු 04කට ලකුණු 02යි)

(ආ) මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ණය සීමා පැනවීමේ අරමුණු **දෙකක්** පැහැදිලි කරන්න.

(i) මුදල් සැපයුම පාලනය කිරීම
(ii) උද්ධමනය පාලනය කිරීම
(iii) තෝරාගත් ක්ෂේත්‍රවල ආයෝජනය ධෛර්යමත් කිරීම හෝ අධෛර්යමත් කිරීම
(iv) බැංකු කටයුතු පාලනය කිරීම

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 02කට ලකුණු 01යි)
(එක් පැහැදිලි කිරීමකට ලකුණු 1/2 බැගින් 02කට ලකුණු 01යි)
(ලකුණු 04යි)

(ii) (අ) පාරිභෝගික අයිතීන් තහවුරු කිරීම තුළින් ව්‍යාපාරිකයකුට අත් කර ගත හැකි වාසි **දෙකක්** පැහැදිලි කරන්න.

(i) සේවක ආකර්ෂණය පහසු වීම
(ii) විකුණුම් ඉහළ යාම
(iii) ලාභය වැඩිවීම
(iv) ව්‍යාපාරයේ කීර්තිනාමය හා ප්‍රතිරූපය ඉහළ යාම
(v) පාරිභෝගික පැමිණිලි අඩුවීම
(vi) ප්‍රමිතිගත නිෂ්පාදන නිසා නාස්තිය හා අපතේ යාම් අඩුවීම

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 02කට ලකුණු 01යි)
(එක් පැහැදිලි කිරීමකට ලකුණු 1/2 බැගින් 02කට ලකුණු 01යි)

(ආ) පුද්ගලයකු තම දියණියගේ නම යොදා ගනිමින් 'යසෝධා කේටරින් සර්විස්' නමින් ව්‍යාපාරයක් ආරම්භ කරන්නේ නම්, ඒ සඳහා අදාළ විධිවිධානය කුමක් ද?

<u>ව්‍යාපාර නාම ආඥා පනත</u> යටතේ (1918 අංක 06) අදාළ <u>ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ</u> ලියාපදිංචි කළ යුතුය.

(ඉරි ඇඳි එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02ට ලකුණු 02යි)
(ලකුණු 04යි)

(iii) (අ) හවුල් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට වඩා කේවල ස්වාමි ව්‍යාපාරයක් ආරම්භ කිරීම යෝග්‍ය යැයි පුද්ගලයකු අදහස් කරයි. මෙම අදහසට එකඟවීම සඳහා හේතු **දෙකක්** දක්වන්න.

(i) හවුල් ව්‍යාපාරයකට වඩා පහසුවෙන් ආරම්භ කළ හැකිවීම
(ii) ස්වාධීනව තීරණ ගත හැකිවීම
(iii) ලාභය තනිව භුක්ති විඳිය හැකිවීම
(iv) ව්‍යාපාරයේ රහස්‍යභාවය ආරක්ෂා කර ගත හැකිවීම
(v) සිය කැපවීම හා පූර්ණ ශ්‍රමය මත ව්‍යාපාරය දියුණු කර ගත හැකිවීම
(vi) ගනුදෙනුකරුවන් හා ව්‍යාපාරය අතර දැඩි සම්බන්ධතාවක් ඇති කර ගත හැකිවීම

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02කට ලකුණු 02යි)

(ආ) සීමිත පොදු සමාගමක් හා සැසඳීමේ දී සීමිත පෞද්ගලික සමාගමක ඇති අවාසි **දෙකක්** සඳහන් කරන්න.

(i) කොටස්කරුවන් සීමා වීම නිසා වැඩි ප්‍රාග්ධනයක් රැස් කර ගත නොහැකි වීම
(ii) ණය ප්‍රාග්ධනය සම්පාදනය සීමා වීම
(iii) අතිරේක ප්‍රාග්ධනය සපයා ගැනීම සඳහා කොටස් ප්‍රසිද්ධියේ අලෙවි කළ නොහැක
(iv) නීතිමය වශයෙන් පාලනයේ ඇති සීමාසහිත බව නිසා වංචා ඇතිවීමට ඉඩකඩ වැඩිවීම

(එක් අවාසියකට ලකුණු 01 බැගින් 02කට ලකුණු 02යි)

(ලකුණු 04යි)

(iv) සමුපකාර ව්‍යාපාරය ජනතාව අතර ජනප්‍රිය කරලීම සඳහා ඔබ විසින් කරනු ලබන යෝජනා **හතරක්** පැහැදිලි කරන්න.

(i) සාමාජික ප්‍රතිලාභ වැඩි කිරීම
(ii) සමුපකාර ව්‍යාපාරයට සාමාජිකයින් වශයෙන් තරුණ ප්‍රජාව බඳවා ගැනීමේ වැඩපිළිවෙළක් ආරම්භ කිරීම
(iii) ප්‍රජාව දැනුවත් කිරීම
(iv) විවිධ ව්‍යාපාර ක්ෂේත්‍රවලට යොමුවීම (ප්‍රවාහනය, ආරෝග්‍ය ශාලා වැනි)
(v) නව අලෙවි ප්‍රවර්ධන ක්‍රම භාවිත කිරීම
(vi) වැඩි කාලයක් විවෘතව තැබීම
(vii) නව තාක්ෂණය යොදා ගැනීම
(viiii)සේවකයන් හා කළමනාකරුවන් පුහුණුව හා සංවර්ධනය

(එක් යෝජනාවකට ලකුණු 1/2 බැගින් 04කට ලකුණු 02යි)

(එක් පැහැදිලි කිරීමකට ලකුණු 1/2 බැගින් පැහැදිලි කිරීම් 04කට ලකුණු 02යි)

(ලකුණු 04යි)


(v) "රටක ආර්ථික සංවර්ධනයට ව්‍යවසායකත්වය දායක වෙයි." මෙම අදහස උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

ව්‍යවසායකත්වය නිසා ව්‍යාපාර ආරම්භ වේ. එමගින් නව රැකියා අවස්ථා බිහි වේ. එමෙන්ම නවෝත්පාදන බිහිවීම තුළින් නව ව්‍යාපාර අවස්ථා ඇති වේ. නව භාණ්ඩ වෙළෙඳපොළට පිවිසීම නිසා දළ දේශීය නිෂ්පාදනය ඉහළ යන අතර ජනතාවගේ ජීවන තත්ත්වය ද උසස් වේ. වෙළෙඳපොළ පුළුල් වීමත්, නව තරගකාරී වෙළෙඳපොළවල් බිහි වීමත් සිදු වේ. ප්‍රාදේශීය සම්පත් භාවිතයට ගැනීමෙන් ඒවාට ඉහළ ඉල්ලුමක් ඇති වී ජනතාවගේ ආදායම ඉහළ යයි. මෙම කරුණුවල ප්‍රතිඵලයක් වශයෙන් ආර්ථික සංවර්ධනය ඇති වේ.

(උදාහරණ 04ක් දක්වමින් සම්පූර්ණ පැහැදිලි කිරීමකට ලකුණු 02යි)

(මුළු ලකුණු 20යි)

2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා




2 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය

2 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 87%කි. (ප්‍රස්තාරය 02) මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 10%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 32%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 39%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 19%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 58%ක් වන අතර, අපේක්ෂකයන්ගෙන් 42%ක්ම ලබා ගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 08 අතුරෙන් පහසුතාව වැඩිම කොටස (iii) (අ) වන අතර එහි පහසුතාව 91%කි. එසේම පහසුතාව අඩුම කොටස වන්නේ (i) (ආ) වන අතර එහි පහසුතාව 43%කි. සෙසු ප්‍රශ්න කොටස්වල පහසුතාව පිළිබඳ තොරතුරු මෙම ප්‍රස්තාරයෙන් පැහැදිලි වේ.

දෙවන ප්‍රශ්නයෙහි (i) (අ) අනුකොටසෙහි පහසුතාව 47%කි. එසේ පහසුතාව පහළයාමට හේතුව ප්‍රශ්නයෙන් බලාපොරොත්තු වූ පරිදි බදු පැනවීම ව්‍යාපාර කෙරෙහි බලපෑමට හේතු ඉදිරිපත් කළද බලපාන ආකාරය පිළිබඳව පැහැදිලි කිරීම ප්‍රමාණවත් ලෙස ඉදිරිපත් කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වීමයි. ප්‍රශ්නයෙන් පැහැදිලි කිරීමක් බලාපොරොත්තු වූ විට හේතු පමණක් නොව ඒවා කෙටියෙන් පැහැදිලි කිරීමට අපේක්ෂකයින් හට මනා පරිචයක් ලබා දිය යුතුය.

දෙවන ප්‍රශ්නයෙහි (i) (ආ) අනුකොටසෙහි පහසුතාව 43%කි. මෙසේ පහසුතාව අඩු වීමට හේතුව මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුව භාවිත කරන එක් එක් උපකරණ හා ඒවායේ අරමුණු පිළිබඳව විස්තරාත්මක අවබෝධයක් අපේක්ෂකයින් තුළ නොමැති වීමයි. එහෙයින් මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුව භාවිත කරනු ලබන එක් එක් උපකරණ හා ඒවායේ අරමුණු පිළිබඳව විස්තරාත්මකව අපේක්ෂකයින් දැනුවත් විය යුතුය.

දෙවන ප්‍රශ්නයෙහි (iii) (ආ) අනුකොටසෙහි පහසුතාව 48%කි. සීමිත පොදු සමාගමක් හා සැසඳීමේදී සීමිත පෞද්ගලික සමාගමක ඇති අවාසි දැක්වීම වෙනුවට මෙම සමාගම් දෙකෙහි වෙනස්කම් දක්වා තිබීම මෙසේ පහසුතාව අඩු වීමට හේතු වී ඇත. ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේදී ව්‍යාපාර සංවිධානවල ලක්ෂණ, වෙනස්කම් මෙන්ම එම ව්‍යාපාර සංවිධානයන්හි ලක්ෂණ හේතුවෙන් සිදුවන වාසි හා අවාසි පිළිබඳව සාපේක්ෂව සැසඳීමේ දැනුම හා අවබෝධය අපේක්ෂකයින්ට ප්‍රගුණ කළ යුතුය.

දෙවන ප්‍රශ්නයෙහි (iv) කොටසෙහි පහසුතාව 46%කි. මෙවැනි අඩු සාධන තත්ත්වයක් ඇති වීමට හේතුව සමූපකාර ව්‍යාපාරය (Coperative Movement) යන සංකල්පය පිළිබඳව අපේක්ෂකයින් තුළ නිවැරදි අවබෝධයක් නොමැති වීම හා පිළිතුර පැහැදිලි කර නොමැති වීමත් ය. එහෙයින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේදී සමූපකාරය හා සමූපකාර ව්‍යාපාරය යන පද දෙකෙහි වෙනස්කම් පිළිබඳව අපේක්ෂකයින් දැනුවත් විය යුතුය.

3 ප්‍රශ්නය

3. (i) (අ) දැනට පවත්වාගෙන යන ව්‍යාපාරයක් අත්පත් කර ගැනීමෙන් ව්‍යාපාරිකයකුට ලැබෙන වාසි දෙකක් සඳහන් කරන්න.

(i) ආරම්භයේදී ම වෙළෙඳපොළක් සහිත වීම
(ii) ආරම්භයේ සිටම ආදායම් හා ලාභ ඉපයීමට හැකියාවක් පැවතීම
(iii) පුහුණු සේවකයින් සිටීම
(iv) දැඩි ප්‍රවර්ධන ප්‍රයත්නයක් දැරීමට සිදු නොවීම
(v) පූර්ව ව්‍යාපාරයේ යහපත් ප්‍රතිරූපය හා කීර්ති නාමයෙන් ප්‍රයෝජන ගත හැකිවීම

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02කට ලකුණු 02යි)

(ආ) ව්‍යවසායකත්ව නිපුණතා **හතරක්** විස්තර කරන්න.

(i) ආත්ම විශ්වාසය
(ii) කැපවීම
(iii) තරගකාරි බව
(iv) නිර්මාණශීලී බව
(v) ගැටලු විසඳීමේ හැකියාව
(vi) බලපෑම් කිරීමේ හැකියාව
(vii) අධිෂ්ඨානශීලී බව
(viii) කුසලතා සහිත වීම
(ix) අභියෝග භාර ගැනීමේ හැකියාව
(x) කාර්යක්ෂම නැඹුරුව
(xi) වෙනත් පිළිගත හැකි නිපුණතා

(කරුණු 04ක් නම් කිරීමට ලකුණු 01යි)

(කරුණු 04ක් නම් කර පැහැදිලි කිරීමට ලකුණු 01යි)

(ලකුණු 04යි)

(ii) "කුඩා ව්‍යාපාර බොහොමයක් කෙටි කලකින් අසාර්ථක වේ." කුඩා ව්‍යාපාර අසාර්ථක වීමට බලපාන හේතු **හතරක්** ඇසුරෙන් මෙම අදහස පැහැදිලි කරන්න.

(i) ව්‍යවසායකත්ව හැකියා අඩුවීම
(ii) කළමනාකරණයේ දුර්වලතා සහිත වීම
(iii) මූල්‍ය දුෂ්කරතා පැවතීම
(iv) යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම
(v) නව තාක්ෂණය යොදා නොගැනීම
(vi) මහා පරිමාණ ව්‍යාපාරවලින් එල්ලවන තරගයට මුහුණ දිය නොහැකි වීම
(vii) අලෙවි කිරීමේ දී ඇතිවන ගැටලු
(viii) පවුලේ සාමාජිකයන් අතර ඇතිවන මත භේද
(ix) ශක්‍යතා අධ්‍යයනයකින් තොරව ව්‍යාපාර ආරම්භ කිරීම

(කරුණකට ලකුණු 1/2 බැගින් 04කට ලකුණු 02යි)

(පැහැදිලි කිරීමකට ලකුණු 1/2 බැගින් පැහැදිලි කිරීම් 04කට ලකුණු 02යි)

(ලකුණු 04යි)

(iii) (අ) ATM කාඩ්පතක් තිබුණ ද, ඇතැම් ගනුදෙනුකරුවන් මුදල් ලබා ගැනීම සඳහා බැංකුවේ කවුන්ටරයට යන බව සමීක්ෂණයකින් හෙළි වී ඇත. ගනුදෙනුකරුවන් ATM කාඩ්පත් භාවිත නොකිරීම සඳහා බල පෑ හැකි හේතු **දෙකක්** දක්වන්න.

(i) භාවිත කිරීමට අවබෝධයක් නොමැතිකම
(ii) අමතර පිරිවැයක් දැරීමට සිදුවීම
(iii) ගනුදෙනුව පිළිබඳ විශ්වාසය අඩුවීම
(iv) පාස්පොතේ ගනුදෙනුව සටහන් නොවීම
(v) සාම්ප්‍රදායිකව කවුන්ටරයෙන් මුදල් ගැනීමට පුරුදු වී සිටීම
(vi) මිනිසුන් සමග ගනුදෙනු කිරීමට ඇති කැමැත්ත
(vii) උපරිම සීමා තිබීම

(එක් හේතුවකට ලකුණු 01 බැගින් හේතු 02ට ලකුණු 02යි)

(ආ) මූල්‍ය සමාගම්වල කාර්ය දෙකක් සඳහන් කර, ඒවා ව්‍යාපාරවල වර්ධනයට දායක වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න.

(i) ණය සැපයීම මගින්
(ii) කුලී පිට ගැණුම් පහසුකම් සැපයීම මගින්
(iii) කල්බදු මූල්‍යකරණය
(iv) තැන්පතු භාර ගැනීම

(කරුණකට ලකුණු 1/2 බැගින් 02කට ලකුණු 01යි)

(පැහැදිලි කිරීමකට ලකුණු 1/2 බැගින් පැහැදිලි කිරීම් 02කට ලකුණු 01යි)

(ලකුණු 04යි)

(iv) (අ) ජංගම ගිණුම් භාවිතයෙන් ව්‍යාපාරිකයින්ට ඇතිවිය හැකි වාසි දෙකක් පැහැදිලි කරන්න.

(i) චෙක්පත් මගින් ගනුදෙනු කළ හැකිවීම
(ii) ස්ථාවර නියෝග මත ගෙවීම් කළ හැකි වීම
(iii) ප්‍රේෂණ පහසුකම් ලබා ගත හැකිවීම
(iv) අයිරා පහසුකම් ලබා ගත හැකිවීම
(v) බැංකු වාර්තා ලබා ගත හැකිවීම
(vi) අනෙකුත් සේවා ලබා ගැනීමේ දී ප්‍රමුඛතාවය හිමිවීම

(වාසියකට ලකුණු 1/2 බැගින් වාසි 02කට ලකුණු 01යි)

(පැහැදිලි කිරීමකට ලකුණු 1/2 බැගින් පැහැදිලි කිරීම් 02කට ලකුණු 01යි)

(ආ) වර්තමානයේ ජංගම දුරකථනය විවිධ කටයුතු සඳහා භාවිත කරයි. ව්‍යාපාරික කටයුතු සඳහා ජංගම දුරකථනය යොදා ගත හැකි අවස්ථා **හතරකට** උදාහරණ දක්වන්න.

(i) ඇණවුම් ලබා ගැනීමට/ ලබා දීමට
(ii) ප්‍රවර්ධන කටයුතු කිරීමට
(iii) ගෙවීම් කටයුතු කිරීමට
(iv) තොරතුරු ලබා ගැනීමට
(v) පාරිභෝගිකයින් හා සේවකයින්, සැපයුම්කරුවන් සමග පණිවුඩ හුවමාරු කිරීමට
(vi) බැංකු ගනුදෙනු සිදු කිරීමට

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 04කට ලකුණු 02යි)

(ලකුණු 04යි)

(v) (අ) පාරිභෝගිකයකුට, ණය කාඩ්පතක් භාවිත කිරීම තුළින් හර කාඩ්පතක් භාවිත කිරීමට වඩා වැඩියෙන් ලබා ගත හැකි වාසි **දෙකක්** ලියන්න.

(i) බැංකු ගිණුමක් නොමැතිව වුවද ණය කාඩ්පතක් භාවිත කිරීමෙන් භාණ්ඩ හෝ මුදල් ලබා ගත හැකිවීම

(ii) ණය කාඩ්පත් හිමියන්ට භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේ දී වට්ටම් ලැබීම (මිල අඩු කිරීම්)

(iii) නිශ්චිත කාලයක් සඳහා පොලී නොමැතිව භාණ්ඩ හා සේවා මිලදී ගත හැකිවීම

(එක් වාසියකට ලකුණු 01 බැගින් වාසි 02ට ලකුණු 02යි)

(ආ) රක්ෂණයෙන් ව්‍යාපාර සංවිධානවලට ලැබෙන වාසි **දෙකක්** විස්තර කරන්න.

(i) ව්‍යාපාර අවදානම් ආවරණය කරන නිසා ව්‍යාපාරවල ආයෝජනයට යොමුවීම

(ii) ජාත්‍යන්තර වෙළෙඳාම වර්ධනයට හේතුවක් වීම

(iii) සේව්‍ය වගකීම් රක්ෂණය මගින් සේවකයන්ට සිදුවන හානි ආවරණය කරගත හැකිවීම

(iv) නිෂ්පාදිත වගකීම් රක්ෂණය මගින් පාරිභෝගිකයින්ට සිදුවිය හැකි හානි ආවරණය කර ගත හැකිවීම


(එක් පැහැදිලි කිරීමකට ලකුණු 01 බැගින් 02ට ලකුණු 02යි)

(ලකුණු 04යි)

(මුළු ලකුණු 20යි)

3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

3 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය




3 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 83%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ. (ප්‍රස්තාරය 02).

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 6%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 28%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 45%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 21%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 66%ක් වන අතර, අපේක්ෂකයන්ගෙන් 34%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩුවෙනි.

3 ප්‍රශ්නයේ කොටස් හා අනුකොටස්වල පහසුතාව



3 ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්

මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 09 අතුරෙන් පහසුතාව වැඩිම කොටස (i) (අ) වන අතර එහි පහසුතාව 79%කි. එසේම පහසුතාව අඩුම කොටස (v) (අ) වන අතර එහි පහසුතාව 48%කි. සෙසු ප්‍රශ්න කොටස්වල පහසුතාවය මෙම ප්‍රස්තාරයෙහි දැක් වේ.

තුන්වන ප්‍රශ්නයෙහි (v) (අ) අනුකොටසෙහි පහසුතාව 48%කි. එසේ පහසුතාව අඩු වීමට හේතුව හර කාඩ්පතකට සාපේක්ෂව ණය කාඩ්පතක් භාවිත කිරීමෙන් පාරිභෝගිකයකුට ලැබිය හැකි වාසි ඉදිරිපත් කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වීමයි. එහෙයින් ණය කාඩ්පත් හා හර කාඩ්පත්වල වාසි හා අවාසි ඒ ඒ කාඩ්පත්වලට සාපේක්ෂව දැක්වීම කෙරෙහි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේදී වැඩි අවධානය යොමුකළ යුතුය.

4 ප්‍රශ්නය

4. (i) මේ වසරේ පාසල් විවාදයේ තේමාව, "ව්‍යාපාර දියුණුව සඳහා මහාමාර්ග සංවර්ධනයට වඩා දුම්රිය මාර්ග සංවර්ධනය වැදගත් වේ." යන්නයි. පාසලේ විවාද කණ්ඩායමේ සාමාජිකයකු ලෙස ඔබ එම මතයට පක්ෂව හා විපක්ෂව ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන කරුණු **දෙක** බැගින් විස්තර කරන්න.

පක්ෂව :

(i) භාණ්ඩ වැඩි ප්‍රමාණයක් ප්‍රවාහනය කර ගත හැකිවීම
(ii) ප්‍රවාහනය සඳහා දැරිය යුතු පිරිවැය අඩුවීම
(iii) භාණ්ඩවල ස්වභාවය අනුව මැදිරි යොදා ගත හැකිවීම
(iv) නාස්තිය හා අපතේ යාම අඩුවීම
(v) ඉක්මනින් භාණ්ඩ හා සේවකයින් ප්‍රවාහනය කළ හැකිවීම

(කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02කට ලකුණු 02යි)

විපක්ෂව :

(i) ගමනාන්තය දක්වා යොදා ගැනීමට නොහැකි නිසා වෙනත් ප්‍රවාහන ක්‍රමයක් යොදා ගැනීමට සිදු වීමෙන් අමතර පිරිවැයක් දැරිය යුතුවීම
(ii) අවශ්‍ය ඕනෑම වේලාවක භාවිත කළ නොහැකි වීම නිසා කලට වේලාවට භාණ්ඩ හා සේවකයින් ප්‍රවාහනය කළ නොහැකි වීම
(iii) දුම්රිය මාර්ගයෙහි සංඥා ඇණ හිටීම ආදී කරුණු නිසා ප්‍රමාදවීම් ඇතිවීමෙන් ව්‍යාපාර කටයුතු අඛණ්ඩව කරගෙන යාමේදී බාධා ඇතිවීම

(කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02කට ලකුණු 02යි)

(ලකුණු 04යි)

(ii) (අ) මුහුණට මුහුණලා කෙරෙන වාචික සන්නිවේදනයේ ඇතිවිය හැකි ගැටළු **හතරක්** සඳහන් කරන්න.

(i) සන්නිවේදනය සිදු කළ බවට සාක්ෂි නොමැති වීම
(ii) අංග චලනයන් වැරදියට වටහා ගැනීම
(iii) භාෂාමය ගැටලු ඇතිවීම නිසා සඵලදායී ලෙස සන්නිවේදනය සිදු නොවීම
(iv) පුද්ගලයාගේ පෙනුම මත ආකල්පමය ගැටලු ඇතිවිය හැකිවීම
(v) මුහුණට මුහුණ හමු වී සාකච්ඡා කිරීමේ දී හැඟීම් පාලනය කර ගැනීමට නොහැකි වීමෙන් ගැටලු ඇතිවීම (ආවේගාත්මක හැඟීම් ඇතිවීම)
(vi) සූදානමක් නොමැතිව සන්නිවේදනය සිදු කිරීමේ දී විවිධ ගැටලු ඇතිවිය හැකිවීම

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 04කට ලකුණු 02යි)

(ආ) අන්තර්ජාලය හරහා ලිපි ගනුදෙනු කිරීමේ වාසි හා අවාසි **දෙක** බැගින් ලියන්න.

වාසි :
(i) වේගවත් වීම
(ii) පිරිවැය අඩුවීම
(iii) එකවර විශාල පිරිසක් සමඟ ලිපි ගනුදෙනු කළ හැකිවීම
(iv) රූප, ශබ්ද, ප්‍රස්තාර සහිතව ලිපි ගනුදෙනු කළ හැකිවීම
(v) රහස්‍යභාවය ආරක්ෂා වීම
(vi) පණිවුඩය ලද බව එවෙලේම දැනගත හැකිවීම
(vii) ගබඩා කළ හැකිවීම
(viii) ඕනෑම වෙලාවක ලිපි ගනුදෙනු කළ හැකිවීම
(ix) ලිඛිත සාක්ෂියක් වීම

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 02කට ලකුණු 01යි)

අවාසි :

(i) භාවිතය සඳහා තාක්ෂණික දැනුමක් අවශ්‍ය වීම
(ii) වෙනත් පාර්ශවයන්ට අයථා ක්‍රමවලින් කරුණු ලබා ගැනීමට හැකි වීම නිසා ආරක්ෂාව පිළිබඳ ගැටලු ඇතිවීම
(iii) තාක්ෂණික ගැටලු නිසා සන්නිවේදනයේ බාධා ඇතිවීම
(iv) ලිපි ගනුදෙනු සිදු කරන දෙපාර්ශවයටම අදාළ පහසුකම් තිබිය යුතුවීම

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 02කට ලකුණු 01යි)

(ලකුණු 04යි)

(iii) (අ) කෘෂිකාර්මික නිෂ්පාදිතවල මිල ගණන් ඉහළ යාමට ගොවියා හා වෙළෙන්දා යන දෙදෙනා ම වගකිව යුතු වන බව උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

ගොවියා :

(i) වගාවේදී අස්වැන්න නෙලීමේදී, ගබඩා කිරීමේදී, ප්‍රවාහනය කිරීමේදී නිවැරදි ක්‍රම අනුගමනය නොකිරීම
(ii) ඵලදායීතාව අඩුවීම
(iii) යෙදවුම් පිරිවැය ඉහළ යාම/ යෙදවුම් නියමාකාරයෙන් භාවිත නොකිරීම
(iv) ගොවීන් අතර ඇතිවන සංවිධානමය ශක්තිය හේතුවෙන් සැපයුම් පාලනය කිරීම
(v) සැලසුම් කිරීමේ දුර්වලතා

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 02කට ලකුණු 01යි)

වෙළෙන්දා :

(i) අලාභය අවම කර ගැනීමට හා ලාභය වැඩි කර ගැනීමට ඉහළ මිල ගණන් නියම කිරීම
(ii) වෙළෙඳුන් අතර සංවිධානගත වීමෙන් සැපයුම පාලනය කිරීම
(iii) ප්‍රවාහනයේ දී හා ගබඩා කිරීමේ දී නිසි ක්‍රම භාවිත නොකිරීම නිසා නාස්තිය හා අපතේ යාම් වැඩි වීමෙන් මිල ඉහළ යාම
(iv) අතරමැදියන් සංඛ්‍යාව ඉහළ යාම
(v) අනිසි තොග රැස් කිරීම

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 02කට ලකුණු 01යි)

(ආ) ජාත්‍යන්තර වෙළෙඳපොළට පිවිසීමේ දී දේශීය ව්‍යාපාරිකයින්ට මුහුණ දීමට සිදුවන බාධක **හතරක්** විස්තර කරන්න.

(i) තීරු බදු බාධක
(ii) රේගු නීති රීති
(iii) අපනයන සීමා කිරීම/ අපනයන පංගු නියම කිරීම
(iv) ආනයන සීමා කිරීම/ ආනයන පංගු නියම කිරීම
(v) භාෂාමය හා සංස්කෘතිකමය ගැටලු
(vi) භාණ්ඩවල ගුණත්වය පිළිබඳ ගැටලු
(vii) ගැණුම්කරුවන් සොයාගැනීමේ ගැටලු
(viii) ඇඩි තරගකාරිත්වය
(ix) වෙළෙඳ ගිවිසුම් මගින් විවිධ බාධා ඇතිවීම
(x) විදේශ විනිමය උච්චාවචනයන්

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 04කට ලකුණු 02යි)

(ලකුණු 04යි)

(iv) ජාත්‍යන්තර වෙළෙඳ ගිවිසුම් ඇති කර ගැනීම තුළින් ව්‍යාපාරවලට ඇතිවිය හැකි වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** පැහැදිලි කරන්න.

වාසි :
(i) වෙළෙඳපොල පුළුල් වීම්/ නිශ්චිත වෙළෙඳපොළක් පැවතීම
(ii) අන්තර්ජාතික සහයෝගීතාව වර්ධනය වීම
(iii) මිල උච්ඡාවචනයන්ට මුහුණදීම පහසුවීම
(iv) බදු සහන ලබා ගත හැකිවීම
(v) තීරු බදු සහන නිසා තරගකාරිත්වයට මුහුණ දිය හැකිවීම

(වාසියකට ලකුණු 01 බැගින් වාසි 02කට ලකුණු 02යි)

අවාසි :
(i) ගිවිසුමකට ඇතුල් වීම නිසා බාධා අවම වීමෙන් ව්‍යාපාරිකයන් අතර තරගකාරිත්වය ඉහළ යාම
(ii) ගිවිසුමෙහි නීතිරීතිවලට හා කොන්දේසිවලට යටත්වීමට සිදුවීම
(iii) ගිවිසුමෙහි කොන්දේසි කඩවීමෙන් ගැටලු ඇතිවිය හැකිවීම
(iv) දේශීය ළදරු කර්මාන්ත විනාශවීම

(අවාසියකට ලකුණු 01 බැගින් අවාසි 02කට ලකුණු 02යි)

(ලකුණු 04යි)

(v) (අ) විද්‍යුත් වෙළෙඳාමෙන් ව්‍යාපාරිකයකුට අත්පත් කරගත හැකි වාසි **දෙකක්** සඳහන් කරන්න.

(i) වෙළෙඳපොළ පුළුල්වීම
(ii) ගනුදෙනුව වේගවත්වීම
(iii) ගනුදෙනුවට අදාළ ක්‍රියාකාරී පිරිවැය අවමවීම
(iv) පැය 24 පුරාම ගනුදෙනු කළ හැකිවීම
(v) විශාල ඉඩකඩක් අවශ්‍ය නොවීම
(vi) අතරමැදියන්ගෙන් තොරව වෙළෙඳ කටයුතු කළ නොහැකි වීම

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02කට ලකුණු 02යි)


(ආ) විද්‍යුත් වෙළෙඳාමෙන් පාරිභෝගිකයකුට ඇතිවන අවාසි **දෙකක්** සඳහන් කරන්න.
(i) භාණ්ඩ භෞතිකව පරීක්ෂාකළ නොහැකිවීම
(ii) නියමිත භාණ්ඩයම ලැබේ දැයි නිශ්චිත නොවීම
(iii) ගනුදෙනුවෙහි ආරක්ෂාව පිළිබඳ ගැටලු ඇතිවීම

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02කට ලකුණු 02යි)

(ලකුණු 04යි)

(මුළු ලකුණු 20යි)


4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා



4 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 66%කි. (ප්‍රස්තාරය 02) මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ. II ප්‍රශ්න පත්‍රයෙහි I වන කොටසෙන් අඩුම ප්‍රතිශතයක් තෝරා ගත් ප්‍රශ්නය මෙයයි.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 10%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 38%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 40%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 12%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 52%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 48%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 07 අතුරෙන් පහසුතාව වැඩිම කොටස (ii) (ආ) කොටස වන අතර එහි පහසුතාව 71%කි. එසේම පහසුතාව අඩුම කොටස් වන්නේ (iii) (අ) සහ (iv) කොටස් වන අතර එහි පහසුතාව 42%කි. සෙසු ප්‍රශ්න කොටස්වල පහසුතාව ප්‍රස්තාරයෙහි දැක් වේ.

හතරවන ප්‍රශ්නයෙහි (iii) (අ) අනුකොටසෙහි පහසුතාව 42%කි. මෙසේ පහසුතාව අඩු වීමට හේතුව කෘෂිකාර්මික නිෂ්පාදිතවල මිල ගණන් ඉහළයාම කෙරෙහි ගොවියා හා වෙළෙන්දාගේ කාර්යයන් තුළින් සිදුවන බලපෑම පිළිබඳව ප්‍රායෝගික දැනුම අපේක්ෂකයින් තුළ නොමැති වීමයි. එහෙයින් භාණ්ඩයක හෝ සේවාවක මිල තීරණය කිරීමේදී නිෂ්පාදිතයට දායක වන ඒ ඒ පාර්ශවයන්ගේ කාර්යයන් බලපානු ලබන ආකාරය පිළිබඳව අපේක්ෂකයින් හට ප්‍රායෝගික දැනුමක් ලබා දිය යුතුය.

හතරවන ප්‍රශ්නයෙහි (iii) (ආ) අනුකොටසෙහි පහසුතාව 48%කි. මෙසේ අඩු පහසුතාවයක් ඇති වීමට හේතු වී ඇත්තේ ජාත්‍යන්තර වෙළෙඳාමට ඇති බාධක පිළිබඳව ප්‍රායෝගික අවබෝධයක් අපේක්ෂකයින් තුළ නොමැති වීමයි. මෙම බාධක පිළිබඳව සවිස්තරාත්මකව ඉදිරිපත් කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වී ඇත. එහෙයින් ජාත්‍යන්තර වෙළෙඳාමට පිවිසීමේ දී දේශීය ව්‍යාපාරිකයින්ට මුහුණදීමට සිදුවන බාධක පිළිබඳ දැනුම සහ ඒවා සවිස්තරාත්මකව ඉදිරිපත් කිරීමේ හැකියාව අපේක්ෂකයන් ප්‍රගුණ කරගත යුතුය.

හතරවන ප්‍රශ්නයෙහි (iv) කොටසෙහි පහසුතාව 42%කි. මෙවැනි අඩු සාධන තත්ත්වයක් ඇති වීමට හේතුව වෙළෙඳ ගිවිසුම් තුළින් ව්‍යාපාරවලට ඇතිවන බලපෑම් පිළිබඳව විස්තර කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වීමයි. එහෙයින් ජාත්‍යන්තර වෙළෙඳ ගිවිසුම් පිළිබඳව මෙන්ම එම වෙළෙඳ ගිවිසුම් මගින් ව්‍යාපාර, සමාජය, ආර්ථිකය ආදී විවිධ අංශවලට සිදුවන බලපෑම් පිළිබඳව ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේදී අවධානය යොමු කළ යුතුය.

II කොටස

5 ප්‍රශ්නය

5. (i) (අ) කළමනාකරුවකුගේ එක් අන්තර්පුද්ගල භූමිකාවක් තෝරාගෙන එම භූමිකාව තුළ ඉටු කළ යුතු කාර්ය **දෙකක්** උදාහරණ දක්වමින් විස්තර කරන්න.

භූමිකාව	කාර්යය හා උදාහරණ
අන්තර්පුද්ගල භූමිකා	
• ප්‍රධානියා	නීතිමය උත්සවමය හෝ සමාජයීය කාර්යයන්හි දී සංවිධානයේ ප්‍රධානියා ලෙස පෙනී සිටීම උදා : නව ශාඛාවන් විවෘත කිරීම අමුත්තන් පිළිගැනීම කොටස්හිමියන්ගේ රැස්වීම් ඇමතීම ගිවිසුම් අත්සන් කිරීම
• නායකයා	සංවිධානමය අරමුණු ඉටු කර ගැනීම සඳහා යටත් නිලධාරීන් දිරිමත් කිරීම හා අභිප්‍රේරණය කිරීම උදා : සේවක කටයුතු අගය කිරීම ගුණ දොස් දැකීම සේවකයින් උසස් කිරීම්, මාරු කිරීම්, ඉවත් කිරීම්
• සබඳතා පවත්වන්නා	තොරතුරු සපයන බාහිර පාර්ශව හා සංවිධානය අතර සබඳතා පැවැත්වීම උදා : ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන්, වෙළෙඳ සංගම් හා ප්‍රාදේශීය ජනතාව සමඟ සබඳතා පැවැත්වීම
(භූමිකාව නම් කිරීමට ලකුණු 1/2) (කාර්යයන් 02ක් උදාහරණ රහිතව සඳහන් කිරීමට ලකුණු 1/2 බැගින් ලකුණු 1) (කාර්යයන් 02ම උදාහරණ සහිතව පැහැදිලි කිරීමට ලකුණු 1 1/2යි)	

(ආ) කළමනාකරණ තීරණ සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන සාධක **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

(i) සම්පත් පැවතීම
(ii) අවශ්‍ය දැනුම සහිතවීම
(iii) සේවක සහයෝගය පැවතීම
(iv) නිවැරදි නියාමනය හා පාලනය
(v) කාර්යයන් නියමිත පරිදි පැවරීම
(vi) තීරණ පිළිබඳ සියලු පාර්ශවයන් දැනුවත් කිරීම

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 02කට ලකුණු 01යි)

(පැහැදිලි කිරීමකට ලකුණු 1/2 බැගින් කරුණු 02කට ලකුණු 01යි)

(ලකුණු 04යි)

(ii) (අ) රැකියා විශේෂීකරණය මගින් සේවකයෙකුට ඇතිවන අවාසි දෙකක් විස්තර කරන්න.

(i) රැකියාව නීරසවීම නිසා ඵලදායීතාව අඩුවීම
(ii) වෘත්තීය ලෙඩරෝග වැළදීම
(iii) කුසලතාවයන් සීමාවීම
(iv) රැකියාව අහිමි වුවහොත් වෙනත් රැකියාවක් සොයා ගැනීම අපහසුවීම

(එක් අවාසියකට ලකුණු 01 බැගින් අවාසි 02කට ලකුණු 02යි)

(ආ) "සංවිධානයක සාර්ථකත්වයට හොඳ නායකත්වයක් අත්‍යවශ්‍ය වේ." මෙම අදහස හේතු දක්වමින් තහවුරු කරන්න.

(i) සංවිධානයේ දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා සැමගේ දායකත්වය ලබා ගැනීමට
(ii) ඉහළ කාර්ය සාධනය සඳහා සේවකයන් අභිප්‍රේරණයට
(iii) විවිධ අංශ අතර සිටින සේවකයන්ගේ කටයුතු සමායෝජනයට හා මග පෙන්වීමට
(iv) සංවිධානයේ විවිධ අංශ සමඟ සන්නිවේදනය පවත්වා ගැනීමට
(v) සංවිධානයේ කටයුතු පාලනයට
(vi) සහකරුවන්ගේ ආත්ම විශ්වාසය හා මානසික ශක්තිය තහවුරු කිරීමට

(ඉහත හේතු 02ක් දක්වමින් කරන පැහැදිලි කිරීමකට ලකුණු 02යි)

(ලකුණු 04යි)

(iii) (අ) නිෂ්පාදිතයක දෝෂ නිවැරදි කිරීම සඳහා පසු පෝෂණ පාලන අදියරේ දී (Post feedback control stage) ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

(i) යන්ත්‍ර අලුත්වැඩියා කිරීම
(ii) අවසාන නිෂ්පාදිතය පරීක්ෂා කිරීම
(iii) සේවක පුහුණුව
(iv) අමුද්‍රව්‍ය වෙනස් කිරීම
(v) නිෂ්පාදන ක්‍රියාවලියේ අවශ්‍ය වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීම

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02කට ලකුණු 02යි)

(ආ) නිෂ්පාදන ක්‍රමයක් තෝරා ගැනීමේ දී ආයතනයක් විසින් සලකා බැලිය යුතු නිර්ණායක හතරක් සඳහන් කරන්න.

(i) නිෂ්පාදිත ප්‍රමාණය
(ii) නිෂ්පාදිතයේ විවිධත්වය/ නිෂ්පාදිතය
(iii) නිෂ්පාදන ක්‍රියාවලියේ නම්‍යශීලී බව
(iv) නිපදවීම සිදු කරන්නේ ඇණවුමකට අනුවද? වෙළෙඳපොළ සඳහාද? ගබඩා කිරීම සඳහාද?

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 04කට ලකුණු 02යි)

(ලකුණු 04යි)

(iv) (අ) ව්‍යාපාරයක මෙහෙයුම් කටයුතු සාර්ථක වීම සඳහා නිෂ්පාදන, පර්යේෂණ හා සංවර්ධනය බලපාන ආකාර **හතරක්** විස්තර කරන්න.

(i) නිෂ්පාදිතයේ ගුණත්වය ඉහළ නැංවීම
(ii) නිෂ්පාදන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වැඩි කිරීම
(iii) නිෂ්පාදන පිරිවැය අඩු කිරීම
(iv) නව භාණ්ඩ හා සේවා හඳුන්වාදීම
(v) නාස්තිය හා අපතේ යාම් අවම කිරීම
(vi) වඩාත් හොඳින් පාරිභෝගිකයා තෘප්තිමත් කළ හැකිවීම
(vii) තිබෙන භාණ්ඩ වැඩිදියුණු වීම

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 04කට ලකුණු 02යි)

(ආ) ප්‍රවාහ නිෂ්පාදනයේ හිතකර ලක්ෂණ **දෙකක්** දක්වන්න

(i) මහා පරිමාණ වාසි නිසා ඒකක පිරිවැය අඩුවීම
(ii) බොහෝවිට එක් පුද්ගලයෙකු මගින් වුවද නිෂ්පාදන ප්‍රවාහය පාලනය කළ හැකිවීම
(iii) සමස්ත වෙළෙඳපොළ පිළිබඳ අවධානය යොමු කිරීම
(iv) නවීන තාක්ෂණය පහසුවෙන් යොදා ගත හැකිවීම
(v) නියමිත කාලය අවසානයේ දී අර්ධ නිමි භාණ්ඩ නොමැතිවීම

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02කට ලකුණු 02යි)

(ලකුණු 04යි)

(v) (අ) තොග පාලනයකින් ව්‍යාපාරයකට ලබාගත හැකි වාසි **දෙකක්** විස්තර කරන්න.

(i) අතිරික්ත තොග නොමැතිවීම නිසා කාරක ප්‍රාග්ධන ගැටලු මතු නොවීම
(ii) තොග ඌණතා නොමැති වීමෙන් නිෂ්පාදන ක්‍රියාවලිය අඛන්ඩව කරගෙන යාමට හැකිවීම
(iii) නාස්තිය හා අපතේ යාම අවම වීමෙන් පිරිවැය අවම කරගත හැකිවීම
(iv) ගබඩා වියදම්, ඇණවුම් වියදම්, ප්‍රවාහන වියදම් යන ආදිය අවම කරගත හැකිවීම
(v) භාණ්ඩ සැපයුම නොකඩවා කරගෙන යා හැකි වීමෙන් පාරිභෝගිකයා තෘප්තිමත් කළ හැකිවීම
(vi) යන්ත්‍ර සූත්‍ර, ශ්‍රමය ආදී සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගත හැකිවීම

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02කට ලකුණු 02යි)


(ආ) සංවිධානයකට ශ්‍රම ඵලදායීතාව වර්ධනය කර ගත හැකි ආකාර **දෙකක්** සඳහන් කරන්න.

(i) සේවක අභිප්‍රේරණය/ දිරි ගැන්වීම මගින්
(ii) සේවක පුහුණු කිරීම මගින්
(iii) නව තාක්ෂණ ක්‍රම යොදා ගැනීම මගින්
(iv) ගුණාත්මක යෙදවුම් යොදා ගැනීම මගින්
(v) සේවකයන් තීරණ ගැනීමට ආයක කර ගැනීම
(vi) සේවක සුබසාධනය වැඩි කිරීම

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02කට ලකුණු 02යි)

(මුළු ලකුණු 20යි)


5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා



5 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 82%කි. (ප්‍රස්තාරය 02) මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 19%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 40%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 33%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 8%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 41%ක් වන අතර, අපේක්ෂකයන්ගෙන් 59%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 10 අතුරෙන් පහසුතාව වැඩිම කොටස වන්නේ (ii) (අ) කොටස වේ. එහි පහසුතාව 80% වේ. එසේම පහසුතාව අඩුම කොටස වන්නේ (iii) (ආ) වන අතර එහි පහසුතාව 19% කි. සෙසු අනුකොටස්වල පහසුතාව ප්‍රස්තාරයෙන් දැක් වේ.

පස්වන ප්‍රශ්නයෙහි (i) (අ) අනුකොටසෙහි පහසුතාව 49%කි. මෙසේ පහසුතාව අඩු වීමට හේතුව කළමනාකරුවෙකුගේ අන්තර්පුද්ගල භූමිකා, උදාහරණ දක්වමින් විස්තර කිරීමට අපේක්ෂකයන් අපොහොසත් වීමයි. එහෙයින් කළමනාකරණ භූමිකා උදාහරණ දක්වමින් විස්තරාත්මකව ඉදිරිපත් කළහැකි ආකාරයට ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කළ යුතු වේ.

පස්වන ප්‍රශ්නයෙහි (i) (ආ) අනුකොටසෙහි පහසුතාව 34%කි. මෙසේ පහසුතාව පහළයාමට හේතු වී ඇත්තේ කළමනාකරණ තීරණ සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍යවන සාධක පැහැදිලි කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වීමයි. එහෙයින් කළමනාකරණ තීරණ පිළිබඳවත්, එම තීරණ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සාධක පිළිබඳවත් සවිස්තරාත්මක අවබෝධයක් අපේක්ෂකයින් ලබාගත යුතුය.

පස්වන ප්‍රශ්නයෙහි (iii) (අ) අනුකොටසෙහි පහසුතාව 37%කි. මෙවැනි අඩු සාධන තත්ත්වයක් ඇති වීමට හේතුව නිෂ්පාදන ක්‍රියාවලියෙහි පසුපෝෂණ පාලන අදියර පිළිබඳව නිවැරදි අවබෝධයක් අපේක්ෂකයින් තුළ නොමැති වීමයි. එහෙයින් නිෂ්පාදිතයක විවිධ අදියරයන්හි දී දෝෂ නිවැරදි කිරීම සඳහා භාවිත කරන පාලන ක්‍රම පිළිබඳව අපේක්ෂකයින්ට ප්‍රායෝගික දැනුමක් ලැබෙන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කරගත යුතුය.

පස්වන ප්‍රශ්නයෙහි (iii) (ආ) අනුකොටසෙහි පහසුතාව 19%කි. මෙවැනි අඩු පහසුතාවයක් ඇති වීමට හේතු වී ඇත්තේ නිෂ්පාදන ක්‍රමයක් තෝරා ගැනීමේ දී ආයතනයක් විසින් සලකා බැලිය යුතු නිර්ණායක පිළිබඳව අපේක්ෂකයන් තුළ අවබෝධයක් නොමැති වීමයි. එහෙයින් කාර්ය, කාණ්ඩ හා ප්‍රවාහ යන නිෂ්පාදන ක්‍රම අතුරින් යෝග්‍ය නිෂ්පාදන ක්‍රමය තෝරා ගැනීමේ දී ආයතනයක් පදනම් කර ගන්නා නිර්ණායක පිළිබඳ නිවැරදි අවබෝධයක් අපේක්ෂකයින් ලබාගත යුතු වේ.

පස්වන ප්‍රශ්නයෙහි (iv) (අ) අනුකොටසෙහි පහසුතාව 45%කි. මෙසේ පහසුතාව පහළයාමට හේතු වී ඇත්තේ ව්‍යාපාරයක මෙහෙයුම් කටයුතු සාර්ථකවීම සඳහා නිෂ්පාදන, පර්යේෂණ හා සංවර්ධනය බලපාන ආකාරය පිළිබඳව අපේක්ෂකයන් තුළ සවිස්තරාත්මක අවබෝධයක් නොමැතිවීමයි. ව්‍යාපාරයක මෙහෙයුම්, අලෙවි ආදී සියලුම අංශවල කටයුතු සාර්ථකවීම සඳහා පර්යේෂණය හා සංවර්ධනය ඉවහල් වන ආකාරය පිළිබඳව වෙන වෙනම පැහැදිලි කිරීමට හැකියාව අපේක්ෂකයන් විසින් ප්‍රගුණ කරගත යුතුය.

පස්වන ප්‍රශ්නයෙහි (iv) (ආ) අනුකොටසෙහි පහසුතාව 47%කි. මෙසේ අඩු පහසුතාවයක් ඇති වීමට හේතු වී ඇත්තේ ප්‍රවාහ නිෂ්පාදනයේ හිතකර ලක්ෂණ නිවැරදි ව දැක්වීමට අපේක්ෂකයන්ට නොහැකි වීමයි. කාර්ය, කාණ්ඩ හා ප්‍රවාහ නිෂ්පාදන ක්‍රම යොදා ගැනීමේ දී ඇතිවන හිතකර හා අහිතකර බලපෑම් පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුම තහවුරුවන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කළ යුතුය.

6 ප්‍රශ්නය

6. (i) (අ) සමාජයීය අලෙවිකරණයේ ප්‍රධාන ලක්ෂණ දෙකක් විස්තර කරන්න.

(i) සමාජයේ යහ පැවැත්ම ආරක්ෂාවීම හා වැඩි දියුණුවීම
(ii) සම්පත් අරපිරිමැස්මෙන් භාවිත කිරීම හා මතු පරම්පරාවට සම්පත් ඉතිරි වීම
(iii) පරිසර හිතකාමී භාණ්ඩ නිෂ්පාදනය සිදුවීම
(iv) සමාජ ආරක්ෂාව ඇතිවීම
(v) සමාජයේ පොදු සමාජ අවශ්‍යතාවයන් පිළිබඳව සැලකිලිමත් වී නිෂ්පාදනය හා අලෙවිකරණය සිදුකිරීම
(vi) සමාජයේ දිගු කාලීන පැවැත්ම පිළිබඳ අවධානය යොමුවීම

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02කට ලකුණු 02යි)

(ආ) අලෙවිකරණ මිශ්‍රයේ 'ස්ථානය' (බෙදා හැරීම) නමැති විචල්‍යයට ඇතුළත් මූලිකාංග දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

(i) මාර්ග (බෙදාහැරීම)
(ii) ආවරණය
(iii) ප්‍රදේශ
(iv) මාර්ග මිශ්‍රය
(v) ප්‍රවාහනය
(vi) තොග

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 02කට ලකුණු 01යි)
(පැහැදිලි කිරීමකට ලකුණු 1/2 බැගින් කරුණු 02කට ලකුණු 01යි)
(ලකුණු 04යි)

(ii) (අ) ගුවන් විදුලි යන්ත්‍රයක් උදාහරණයට ගනිමින් 'අපේක්ෂිත නිෂ්පාදිතය' යන සංකල්පය පැහැදිලි කරන්න.

ගැනුම්කරු බලාපොරොත්තු වන ආකාරයට නිෂ්පාදිතයක් ඉදිරිපත් කිරීම අපේක්ෂිත නිෂ්පාදිතයයි.
උදා : ගුවන් විදුලියෙන් බලාපොරොත්තු වන අංග ගුණත්වය හා මෝස්තරය පිළිබඳ උදාහරණයක් මගින් පැහැදිලි කළ යුතුය.

(අපේක්ෂිත නිෂ්පාදිතය පැහැදිලි කිරීමට ලකුණු 1/2යි)
(උදාහරණ 03ක් දැක්වීමට එක් උදාහරණයකට ලකුණු 1/2 බැගින් 3ට ලකුණු 1 1/2යි)

(ආ) නිෂ්පාදිතයක ලේබලයක් තුළින් පාරිභෝගිකයාට දැනගත හැකි තොරතුරු **හතරක්** නම් කරන්න.

(i) නිෂ්පාදනය සම්බන්ධ තොරතුරු (නිෂ්පාදකයා, රට, ලියාපදිංචි අංකය ආදිය)
(ii) භාණ්ඩ හෝ සන්නම
(iii) මිල
(iv) අඩංගු ද්‍රව්‍ය
(v) නිෂ්පාදන දිනය
(vi) කල් ඉකුත් වීමේ දිනය
(vii) ගබඩා කිරීමට හා ප්‍රවාහනයට උපදෙස්
(viii) අනතුරු ඇඟවීම්/ අවවාද
(ix) බර/ පරිමාව
(x) තත්ත්ව සහතිකය

(එක් කරුණකට 1/2 බැගින් 04කට ලකුණු 02යි)

(ලකුණු 04යි)

(iii) (අ) යෝග්‍ය බෙදා හැරීමේ මාර්ගයක් තෝරා ගැනීමේ දී ව්‍යාපාරිකයකු විසින් සැලකිය යුතු ප්‍රධාන සාධක **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.

(i) දැරිය යුතු පිරිවැය
(ii) භාණ්ඩයේ ස්වභාවය
(iii) වෙළෙඳපොළේ ස්වභාවය
(iv) ඉල්ලුමේ ස්වභාවය
(v) නිෂ්පාදකයාගේ ශක්තීන්
(vi) තරගකරුවන්ගේ බෙදා හැරීමේ මාර්ග
(vii) නීතිමය තත්ත්වයන්
(viii) ගතවන කාලය/ වේගය

(එක් කරුණකට 01 බැගින් 02කට ලකුණු 02යි)

(ආ) සබන් නිෂ්පාදකයකුට, සබන් අලෙවිය වැඩි කර ගැනීම සඳහා යොදා ගත හැකි ක්‍රම **හතරක්** සඳහන් කරන්න.

(i) සබන්වල ගුණත්වය, හැඩය, පෙනුම ආදිය වෙනස් කිරීම
(ii) තරගකාරී මිලක් නියම කිරීම
(iii) නව ප්‍රවර්ධන උපක්‍රම භාවිත කිරීම
(iv) පහසුවෙන් මිලදී ගැනීමට අවස්ථාව සැලසීම

(එක් කරුණකට 1/2 බැගින් 04කට ලකුණු 02යි)

(ලකුණු 04යි)

(iv) (අ) මූල්‍ය කළමනාකරණයේ ප්‍රධාන අරමුණු **දෙකක්** දක්වන්න.

(i) ව්‍යාපාර අයිතිකරුවන්ගේ ව්‍යාපාරය හා සබැඳි අගය (ධනය) උපරිම කිරීම
(ii) ලාභය උපරිම කිරීම
(iii) කොටසක ඉපයුම උපරිම කිරීම
(iv) මුදල් අවභාවිතය අවම කිරීම

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02කට ලකුණු 02යි)

(ආ) ණය මුදලක් ලබා ගැනීම සඳහා මූල්‍ය ආයතනයක් තෝරා ගැනීමේ දී ව්‍යාපාරිකයකු විසින් සැලකිලිමත් විය යුතු කරුණු කරුණු **හතරක්** කෙටියෙන් විස්තර කරන්න.

(i) පිරිවැය
(ii) කොන්දේසි
(iii) ආයතනයේ ස්වභාවය
(iv) ඇප සුරැකුම්
(v) ණය මුදල ලබා ගැනීමට ගත වන කාලය
(vi) ලබා ගත හැකි ණය මුදල
(vii) ආයතනය සපයනු ලබන අනෙකුත් සේවාවන්
(viii) අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය
(ix) ආයතනය සමඟ පවතින සම්බන්ධතාවය

(එක් කරුණකට 1/2 බැගින් 04කට ලකුණු 02යි)

(ලකුණු 04යි)

(v) පහත මූල්‍ය අනුපාතවල අපේක්ෂිත හා සත්‍ය තත්ත්වය සසඳමින් ඒ පිළිබඳව ඔබගේ අදහස් දක්වා අපේක්ෂිත තත්ත්වය ලඟාකර ගැනීම සඳහා ගතයුතු එක් ක්‍රියාමාර්ගයක් බැගින් යෝජනා කරන්න. (ඔබගේ පිළිතුරු පතෙහි අදහස් හා ගත යුතු ක්‍රියාමාර්ග පමණක් ලියන්න)

අනුපාතය	අපේක්ෂිත තත්ත්වය	සත්‍ය තත්වය	අදහස	ගත යුතු ක්‍රියාමාර්ගය
1. තොග පිරිවැටුම (වාර)	4	1		
2. ණයගැති පිරිවැටුම (වාර)	4	2		

අදහස	ගත යුතු ක්‍රියාමාර්ගය
1. විකුණුම් අඩුවීම/ තොග රැඳෙන කාලය වැඩිවීම	නව අලෙවි ප්‍රවර්ධන ක්‍රම භාවිත කර විකුණුම් වැඩිකර ගැනීම විකුණුම් වැඩි කිරීමේ ක්‍රම භාවිතය
2. ණයගැතියන්ගෙන් මුදල් එකතු කර ගැනීමට ගතවන කාලය වැඩි බව	මුදල් වට්ටම් දීම, ණය එකතු කර ගැනීමට සිටින සේවකයන් වැඩිකර ගැනීම, සාධ්‍යයකරණය


(අදහසකට ලකුණු 01 බැගින් 02කට ලකුණු 02යි)

(ක්‍රියා මාර්ගයකට ලකුණු 01 බැගින් 02කට ලකුණු 02යි)

(ලකුණු 04යි)

(මුළු ලකුණු 20යි)


6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා



6 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 54%කි. (ප්‍රස්තාරය 02) මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 22%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 44%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 27%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 7%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 34%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 66%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 9 අතුරෙන් පහසුතාව වැඩිම කොටස (ii) (ආ) වන අතර එහි පහසුතාව 92%කි. එසේම පහසුතාව අඩුම කොටස වන්නේ (v) කොටස වන අතර එහි පහසුතාව 29%කි. සෙසු කොටස්වල පහසුතාව ප්‍රස්තාරයෙහි දැක් වේ.

හයවන ප්‍රශ්නයෙහි (i) (අ) අනුකොටසෙහි පහසුතාව 41%කි. මෙසේ පහසුතාව අඩු වීමට හේතු වී ඇත්තේ සමාජයීය අලෙවිකරණ සංකල්පයේ ලක්ෂණ පිළිබඳව සවිස්තරාත්මක අවබෝධයක් අපේක්ෂකයන් තුළ නොමැති වීමයි. එක් එක් අලෙවිකරණ සංකල්ප පිළිබඳව හා එම සංකල්පවලින් පිළිබිඹු වන ලක්ෂණ පිළිබඳව සවිස්තරාත්මක අවබෝධයක් ලැබෙන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කළ යුතු වේ.

හයවන ප්‍රශ්නයෙහි (i) (ආ) අනුකොටසෙහි පහසුතාව 35%කි. මෙසේ පහසුතාව පහළ යාමට හේතුව අලෙවිකරණ මිශ්‍රයේ "ස්ථානය" (බෙදා හැරීම) නමැති විචල්‍යයට ඇතුළත් මූලිකාංග පිළිබඳව විස්තර කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වීමයි. අලෙවිකරණ මිශ්‍රයේ නිෂ්පාදිතය, මිල, ස්ථානය හා ප්‍රවර්ධනය යන විචල්‍යයන් හා එක් එක් විචල්‍යයට ඇතුළත් වන මූලිකාංග පිළිබඳව වෙන වෙනම විස්තර කිරීමේ හැකියාව අපේක්ෂකයන් ප්‍රගුණ කළ යුතුය.

හයවන ප්‍රශ්නයෙහි (ii) (අ) අනුකොටසෙහි පහසුතාව 42%කි. මෙවැනි අඩු සාධන තත්ත්වයක් ඇති වීමට හේතු වී ඇත්තේ නිෂ්පාදිත මට්ටම් පිළිබඳව ගුවන් විදුලි යන්ත්‍රයක් උදාහරණයට ගනිමින් පැහැදිලි කිරීමේ හැකියාව අපේක්ෂකයන් තුළ නොමැති වීමයි. එහෙයින් නිෂ්පාදිතයක මට්ටම් විවිධ නිෂ්පාදිත සඳහා ආදේශ කරමින් පැහැදිලි කිරීමේ හැකියාව ප්‍රායෝගිකව ලබා දෙන අයුරින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කළ යුතුය.

හයවන ප්‍රශ්නයෙහි (v) කොටසෙහි පහසුතාව 29%කි. මෙසේ අඩු පහසුතාවයක් ඇති වීමට හේතුව තොග පිරිවැටුම් අනුපාතය හා ණයගැති පිරිවැටුම් අනුපාතය ව්‍යාපාර ආයතනයක සාර්ථකත්වයට බලපාන ආකාරය පිළිබඳව අපේක්ෂකයන් තුළ අවබෝධයක් නොමැති වීමයි. ව්‍යාපාරයක මූල්‍ය අනුපාතයන් අර්ථකථනය කිරීම තුළින් අදහස් දැක්වීමටත් ඒ අනුව ගතයුතු ක්‍රියාමාර්ග හඳුනා ගැනීමටත් අවශ්‍ය දැනුම හා අවබෝධය අපේක්ෂකයින් ප්‍රගුණ කළ යුතුය.

7 ප්‍රශ්නය

7. (i) (අ) මානව සම්පත් අවශ්‍යතා පුරෝකථනය කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු **හතරක්** ලියන්න.

(i) භාණ්ඩය/ සේවාව සඳහා වූ ඉල්ලුම
(ii) ආයතනයේ පරමාර්ථ
(iii) නිෂ්පාදන ක්‍රම
(iv) අනාගත සේවක විශ්‍රාමයාම
(v) සේවක පිරිවැටුම
(vi) සේවක උසස් වීම්
(vii) අනාගත ව්‍යාපෘති
(viii) සේවය අවසන් කිරීම

(එක් කරුණකට 1/2 බැගින් 04කට ලකුණු 02යි)

(ආ) රැකියා අයදුම්පතකින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයකට අයදුම්කරුවකු පිළිබඳ ලබා ගත හැකි වැදගත් තොරතුරු **හතරක්** ලියන්න.

(i) පෞද්ගලික තොරතුරු (නම, වයස, උපන්දිනය ආදී)
(ii) අධ්‍යාපන සුදුසුකම්
(iii) වෘත්තීය සුදුසුකම්
(iv) විශේෂ කුසලතා
(v) පලපුරුද්ද
(vi) සමාජ සම්බන්ධතාවන්ගේ ස්වභාවය
(vii) අනාගත බලාපොරොත්තු පිළිබඳව අදහසක්
(viii) අතීත සාර්ථකතාවයන්

(එක් කරුණකට 1/2 බැගින් 04කට ලකුණු 02යි)
(ලකුණු 04යි)

(ii) සම්මුඛ පරීක්ෂණයකින් අතැම් විට නිවැරදි පුද්ගලයා තෝරා ගැනීම අපහසු වේ. එසේ වීමට බලපෑ හැකි කරුණු **හතරක්** කෙටියෙන් විස්තර කරන්න.

(i) අපේක්ෂකයාගේ කෘත්‍රිම හැසිරීම
(ii) අපේක්ෂකයාගේ චිත්තවේගී ස්වභාවය නිසා සම්මුඛ පරීක්ෂණයට නිසි ලෙස මුහුණ දිය නොහැකිවීම (අනියත බිය)
(iii) සන්නිවේදන දුර්වලතා (අපේක්ෂකයාගේ)
(iv) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ආකල්ප
(v) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන්ගේ පලපුරුද්ද අඩුබව
(vi) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන් පූර්ව නිගමනවලට එළඹ තිබීම
(vii) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය අපේක්ෂකයාගේ බාහිර පෞරුෂත්වය පිළිබඳව සැලකිල්ලක් දැක්වීම
(viii) අයථා බලපෑම්
(ix) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලවල නිවැරදි නිර්ණායක නොතිබීම

(එක් කරුණකට ලකුණු 01 බැගින් 04කට ලකුණු 04යි)

(iii) (අ) කාර්යඵල ඇගයීමකින් සේවකයෙකුට ලැබෙන ප්‍රතිලාභ **දෙකක්** සඳහන් කරන්න.

(i) සේවක ඵලදායීතාව ඉහළයාම
(ii) සේවක අභිප්‍රේරණය ඇතිවීම
(iii) සේවකයින්ට තම ශක්තීන් හා දුර්වලතා හඳුනාගත හැකිවීම
(iv) තම පුහුණු අවශ්‍යතා හඳුනාගත හැකිවීම
(v) රැකියා ජීවන මාර්ග සැලසුම් කර ගැනීමට පදනමක් ලැබීම
(vi) රැකියාව තුළ ඉදිරියට යෑමට අවස්ථාව හිමිවීම

(එක් කරුණකට ලකුණු 01 බැගින් 02කට ලකුණු 02යි)

(ආ) යහපත් සේව්‍ය - සේවක සම්බන්ධතාවක් පවත්වා ගැනීමට වෘත්තීය සමිතියක් විසින් ඉටු කළ යුතු කාර්යය **දෙකක්** දක්වන්න.

(i) ආයතනයේ කළමනාකරණ තීරණවලට සහය ලබාදීම
(ii) සේවක ගැටලු කළමනාකරණයට දැනුම්දීම හා ඒ පිළිබඳ සාකච්ඡා කිරීම
(iii) සේවක හෝ වෘත්තිමය ගැටලු විසඳීමට කළමනාකරණයට ඇති අපහසුතා සහ බාධක පිළිබඳ සේවකයින් සමඟ සාකච්ඡා කිරීම
(iv) ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ දී කළමනාකරණයට සහය වීම

(එක් කරුණකට ලකුණු 01 බැගින් 02කට ලකුණු 02යි)
(ලකුණු 04යි)

(iv) ව්‍යාපාරයක දෛනික මෙහෙයුම් කටයුතුවලට සම්බන්ධ තොරතුරු දැක්වෙන පහත වගුව ව්‍යාපාර අංශ/ දෙපාර්තමේන්තු සහ ගනුදෙනු සැකසුම් පද්ධති (Transaction Processing Systems) සැලකිල්ලට ගනිමින් අංක 1, 2, 3, 4 යන ස්ථානවලට අදාල පිළිතුරු පමණක් ඔබගේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

ව්‍යාපාර අංශය/ දෙපාර්තමේන්තුව	ගනුදෙනු සැකසුම් පද්ධතිය
........1........	ද්‍රව්‍ය මිලට ගැනීම
මානව සම්පත්	........2........
........3........	මිල කිරීම
ගිණුම්	........4........

(i) නිෂ්පාදන/ මිලදී ගැනීම්
(ii) සේවක පැමිණීම/ වැටුප් වාර්තා සකස් කිරීම/ පුහුණුව හා සංවර්ධනය
(iii) අලෙවි අංශය/ දෙපාර්තමේන්තුව
(iv) අයවැය ලේඛන සැකසීම/ මුදල් ගෙවීම/ පොදු ලෙජරය

(එක් කරුණකට ලකුණු 01 බැගින් 04කට ලකුණු 04යි)
(ලකුණු 04යි)

(v) (අ) හොඳ තොරතුරක පැවතිය යුතු ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.

(i) අදාල බව
(ii) නිවැරදි බව
(iii) පූර්ණ බව
(iv) විශ්වාසදායී බව
(v) සවිස්තරාත්මක බව
(vi) අවශ්‍ය වේලාවට ලබාගත හැකිවීම
(vii) අඩු පිරිවැය
(viii) විවිධ මාධ්‍ය ඔස්සේ ඉදිරිපත් කළ හැකිවීම
(ix) යාවත්කාලීන බව
(x) ආරක්ෂාකාරී වීම
(xi) නම්‍යශීලී බව
(xii) තේරුම්ගත හැකිබව


(එක් කරුණකට ලකුණු 1/2 බැගින් 04කට ලකුණු 02යි)

(ආ) ව්‍යාපාර ආයතනයකට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) භාවිතයෙන් ලැබිය හැකි ප්‍රතිලාභ **හතරක්** දක්වන්න.

(i) නිවැරදි තීරණ ගැනීමට හැකිවීම
(ii) කටයුතුවල වැරදි අවම වීම
(iii) ක්‍රියාවලිය කාර්යක්ෂමව සිදු කර ගත හැකිවීම
(iv) ක්‍රියාවලිය සඵලදායීව සිදු කළ හැකිවීම
(ii) නිමැවුමේ ගුණාත්මක බව ඉහළ යාම
(iii) තොරතුරු ගබඩා කර පසුව ප්‍රයෝජනයට ගත හැකිවීම
(iv) පිරිවැය අවම වීම
(v) සන්නිවේදන ක්‍රියාවලිය පහසුවීම
(vi) පාරිභෝගික සංඛ්‍යාව වැඩි කර ගත හැකිවීම
(vii) අන්තර්ජාතික වෙළෙඳාමට පිවිසිය හැකිවීම

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් 04කට ලකුණු 02යි)
(ලකුණු 04යි)
(මුළු ලකුණු 20යි)


7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා



7 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 62%කි. (ප්‍රස්තාරය 02). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 19%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 39%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 32%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 10%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 42%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 58%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 8 අතුරෙන් පහසුතාව වැඩිම කොටස (v) (අ) වන අතර එහි පහසුතාව 70%කි. එසේම පහසුතාව අඩුම කොටස (i) (අ) වන අතර එහි පහසුතාව 28% කි. සෙසු ප්‍රශ්න කොටස්වල පහසුතාව ප්‍රස්තාරයෙහි දැක් වේ.

හත්වන ප්‍රශ්නයෙහි (i) (අ) අනුකොටසෙහි පහසුතාව 28%කි. මෙසේ පහසුතාව අඩු වීමට හේතුව මානව සම්පත් අවශ්‍යතා පුරෝකථනය කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු පිළිබඳව දැනුම අපේක්ෂකයන් හට නොමැති වීමයි. එහෙයින් මානව සම්පත් සැලසුම්කරණයේ දී මානව සම්පත් අවශ්‍යතා පුරෝකථනය කිරීම පිළිබඳව පුළුල් දැනුමක් හා අවබෝධයක් ලැබෙන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කළ යුතු වේ.

හත්වන ප්‍රශ්නයෙහි (ii) කොටසෙහි පහසුතාව 43%කි. මෙවැනි අඩු සාධන තත්ත්වයක් ඇති වීමට හේතු වී ඇත්තේ සම්මුඛ පරීක්ෂණ ක්‍රමයේ ඇති පොදු දුර්වලතා අතුරෙන් නිවැරදි පුද්ගලයා තෝරාගැනීම අපහසු වීමට බල පෑ හැකි කරුණු විස්තර කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වීමයි. එහෙයින් සේවකයින් තෝරාගැනීමේ ක්‍රම පිළිබඳව පුළුල් අධ්‍යයනයක් කිරීමෙන් අපේක්ෂකයින් ඒ පිළිබඳ අවබෝධය පුළුල් කරගත යුතුය.

හත්වන ප්‍රශ්නයෙහි (iii) (ආ) අනුකොටසෙහි පහසුතාව 39%කි. මෙසේ අඩු පහසුතාවයක් ඇති වීමට හේතුව යහපත් සේව්‍ය - සේවක සම්බන්ධතාවයක් පවත්වා ගැනීමට වෘත්තීය සමිතියක් විසින් ඉටුකළයුතු කාර්යයන් පිළිබඳව අපේක්ෂකයන් තුළ ඇති දැනුම අඩුවීමයි. සේවක අයිතිවාසිකම් දිනා ගැනීමට මෙන්ම යහපත් සේව්‍ය - සේවක සම්බන්ධතාවයක් පවත්වා ගැනීමටද වෘත්තීය සමිති දායක වන බව අවබෝධ වන ආකාරයට ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කළ යුතු වේ.

හත්වන ප්‍රශ්නයෙහි (iv) කොටසෙහි පහසුතාව 44%කි. මෙසේ පහසුතාව පහළයාමට හේතු වී ඇත්තේ ව්‍යාපාරයක දෛනික මෙහෙයුම් කටයුතු සඳහා ගනුදෙනු සැකසුම් පද්ධති ඉවහල්වන ආකාරය පිළිබඳව අවබෝධයක් අපේක්ෂකයන් තුළ නොමැතිවීමයි. තොරතුරු පද්ධති ව්‍යාපාර ආයතනයක විවිධ අංශයන් හි කටයුතු පහසුකිරීම සඳහා භාවිත කරන ආකාරය පිළිබඳව පුළුල් අවබෝධයක් අපේක්ෂකයින්ට ලැබෙන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කළ යුතු වේ.

8 ප්‍රශ්නය

8. (i) (අ) කෙටියෙන් විස්තර කරන්න.

(අ) විද්‍යුත් සම්මන්ත්‍රණය (e- Conference)
(ආ)පාඨ කථනය (Text chatting)
(ඉ) හඬ කථනය (Voice chatting)
(ඊ) වීඩියෝ කථනය (Video chatting)

(අ) **විද්‍යුත් සම්මන්ත්‍රණය**
විවිධ ස්ථානවල සිටියත් මුහුණට මුහුණලා සියලු දෙනාම සම්බන්ධ කරමින් විද්‍යුත් ජාල ඔස්සේ විධිමත් සාකච්ඡා පැවැත්වීම

(ආ) **පාඨ කථනය**
තම අදහස් ටයිප් කර අනෙක් පාර්ශවය වෙත යොමු කිරීම

(ඉ) **හඬ කථනය**
මයික්‍රොෆෝන භාවිත කරමින් වාචික අදහස් හුවමාරු කර ගැනීම

(ඊ) **වීඩියෝ කථනය**
වෙබ් කැමරා භාවිත කරමින් ශබ්දයට අමතරව දර්ශන ද හුවමාරු කර ගැනීම

(කරුණකට ලකුණු 01 බැගින් 04ට ලකුණු 04යි)

(ඉරි ඇඳි පද තිබීම අත්‍යවශ්‍යයි)

(ii) විද්‍යුත් තොරතුරු පද්ධතියක ඇති උපාංග **හතරක්** පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

(i) දෘඩාංග (Hardware)
තොරතුරු පද්ධතියක පවතින සියලුම භෞතික කොටස්

(ii) මෘදුකාංග (Software)
දත්ත සැකසීම සඳහා වන පරිගණකවැඩ සටහන්

(iii) ජීවාංග (liveware)
තොරතුරු පද්ධතිය භාවිතා කරන්නන් හෙවත් පරිශීලකයින්

(iv) දත්ත (Data)
තොරතුරු පද්ධතියට ලබා දෙන මූලික කරුණු

(v) ක්‍රියාපටිපාටි (Procedure)
තොරතුරු පද්ධතියේ කාර්යයන් හා උපාංග පාලනය සඳහා වන සම්මුති, නීති රීති, ප්‍රතිපත්ති

(vi) ආයතනිකාංග (Firmware)
දෘඩාංග නිෂ්පාදනයේ දී දෘඩාංගයට කාවද්දන මෘදුකාංග/ දෘඩාංග පාලනයට යොදන මෘදුකාංග

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 04කට ලකුණු 02යි)

(පැහැදිලි කිරීමකට ලකුණු 1/2 බැගින් කරුණු 04කට ලකුණු 02යි)

(iii) (අ) ව්‍යාපාර සැලැස්මක අවශ්‍යතාවට හේතු දෙකක් ලියන්න.

(1) ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට මග පෙන්වීම
(2) ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශවයන්ට ව්‍යාපාරය පිළිබඳ අවබෝධයක් ලබා දීමට
(3) ව්‍යාපාරයට අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා ගැනීමට
(4) කළමනාකරණ කටයුතු පහසු කිරීමට

(එක් කරුණකට ලකුණු 01බැගින් කරුණු 02කට ලකුණු 02යි)

(ආ) ව්‍යාපාර අදහස් රාශියක් ඇසුරෙන් ක්‍රියාවට නැගිය හැකි අවසාන ව්‍යාපාර අදහස තෝරා ගැනීමේ ක්‍රියාවලියේ පියවර අනුපිළිවෙළ සැලකිල්ලට ගෙන පහත සටහන සම්පූර්ණ කරන්න.
(ඔබගේ පිළිතුරු පතෙහි මෙම සටහන ඇඳ, පිළිතුරු සපයන්න.)

විශ්ලේෂණ ස්වභාවය		ඇගයීමට ගන්නා සාධක වර්ග
(1) සාර්ව	⟶	බාහිර පරිසර සාධක
(2) සූක්ෂම	⟶	අභ්‍යන්තර හා ආසන්න බාහිර පරිසර සාධක

(එක් පිළිතුරකට ලකුණු 1/2 බැගින් කරුණු 04කට ලකුණු 02යි)
(අනුපිළිවෙළ අවශ්‍ය වේ)
(ලකුණු 04)

(iv) (අ) ව්‍යාපාර සැලැස්මක අවශ්‍යතාවට හේතු දෙකක් ලියන්න.

(1) ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය (ප්‍රාග්ධන අවශ්‍යතා)
(2) ඇස්තමේන්තුගත ලාභලාභ (ආදායම් ප්‍රකාශය)
(3) ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය
(4) ඇස්තමේන්තුගත ශේෂ පත්‍රය
(5) ණය ගෙවීමේ සටහන

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02කට ලකුණු 02යි)

(ආ) නිෂ්පාදන නොවන පිරිවැය සඳහා උදාහරණ හතරක් ලියන්න.


(1) ආයතන හා පරිපාලන වියදම්
(2) අලෙවිකරණ වියදම්
(3) මූල්‍ය වියදම්
(4) වෙනත් වියදම්

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 04කට ලකුණු 02යි)
(ලකුණු 04)

(v) ව්‍යාපාරයක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන පුද්ගලයකුට මූල්‍ය විශ්ලේෂණයකින් ගත හැකි තීරණ දෙකක් විස්තර කරන්න.
(1) ව්‍යාපාරය ආරම්භ කළ යුතුද? නැද්ද? යන්න (ශක්‍යතාව)
(2) ආයෝජනයට ලැබෙන ඉපයුම් ප්‍රමාණවත් ද යන්න
(3) එසේ නොවේ නම් ගත යුතු ක්‍රියා මාර්ග මොනවාද යන්න

(එක් කරුණකට ලකුණු 02 බැගින් කරුණු 02කට ලකුණු 02යි)
(මුළු ලකුණු 20)


8 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා



8 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 31%කි. (ප්‍රස්තාරය 02) මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ. II කොටසෙන් අඩුම අපේක්ෂකයින් පිරිසක් තෝරා ගෙන ඇති ප්‍රශ්නය මෙයයි.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 37%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 36%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 22%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 5%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 27%ක් වන අතර, අපේක්ෂකයන්ගෙන් 73%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 10 අතුරෙන් පහසුතාව වැඩිම කොටස (i) (ඊ) වන අතර එහි පහසුතාව 58%කි. එසේම පහසුතාව අඩුම කොටස (iii) (ආ) වන අතර එහි පහසුතාව 10% කි. සෙසු ප්‍රශ්න කොටස්වල පහසුතාවයන් ද ප්‍රස්තාරයෙහි දැක් වේ.

අටවන ප්‍රශ්නයෙහි (i) (අ) අනුකොටසෙහි පහසුතාව 46%කි. මෙයට හේතුව විද්‍යුත් සම්මන්ත්‍රණ පිළිබඳව නිවැරදි අවබෝධයක් අපේක්ෂකයන් තුළ නොමැති වීමයි. කෙටි සටහන් ලිවීමේ දී එහි වාසි, අවාසි, ලක්ෂණ ආදිය සඳහන් කිරීමෙන් වැළකී අදාළ මූලික හැඳින්වීම පමණක් ප්‍රමාණවත් බව අපේක්ෂකයන් දැනුවත් කළ යුතුය. විද්‍යුත් සම්මන්ත්‍රණ පිළිබඳව ප්‍රායෝගික අවබෝධයක් ලැබෙන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කළයුතු වේ.

අටවන ප්‍රශ්නයෙහි (i) (ඉ) අනුකොටසෙහි පහසුතාව 45%කි. මෙසේ පහසුතාව අඩු වීමට හේතුව අන්තර්ජාලය මගින් සැපයෙන සේවාවක් වන හඬ කථනය පිළිබඳව අපේක්ෂකයන් තුළ ඇති අවබෝධය අඩු වීමයි. හඬ කථනය ප්‍රායෝගිකව ක්‍රියාත්මකවන ආකාරය පිළිබඳව අපේක්ෂකයන් තුළ අවබෝධයක් ඇතිවන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කළයුතු වේ.

අටවන ප්‍රශ්නයෙහි (ii) කොටසෙහි පහසුතාව 47%කි. මෙවැනි අඩු සාධන තත්ත්වයක් ඇති වීමට හේතුව විද්‍යුත් තොරතුරු පද්ධතියක ඇති උපාංග විස්තර කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වීමයි. විද්‍යුත් තොරතුරු පද්ධතියක ඇති උපාංග පිළිබඳව ප්‍රායෝගික අවබෝධයක් ලබාදිය හැකිවන සේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කළයුතු වේ.


අටවන ප්‍රශ්නයෙහි (iii) (අ) අනුකොටසෙහි පහසුතාව 49%කි. මෙසේ අඩු පහසුතාවයක් ඇති වීමට හේතුව ව්‍යාපාර සැලැස්මක අවශ්‍යතාව පිළිබඳ නිවැරදි අවබෝධයක් අපේක්ෂකයන් තුළ නොමැතිවීමයි. ආදර්ශ ව්‍යාපාර සැලැස්මක් පිළියෙළ කිරීම තුළින් ව්‍යාපාර සැලැස්ම පිළිබඳව ප්‍රායෝගික අවබෝධයක් අපේක්ෂකයන් ලැබිය යුතුය.

අටවන ප්‍රශ්නයෙහි (iii) (ආ) අනුකොටසෙහි පහසුතාව 10%කි. මෙයට හේතුව ව්‍යාපාර අදහසක් තෝරා ගැනීමේ ක්‍රියාවලියෙහි පියවර අනුපිළිවෙළට දැක්වීමට අපේක්ෂකයින් අපොහොසත් වීමයි. සුදුසු ව්‍යාපාර අදහසක් තෝරා ගැනීම සඳහා පළමුවෙන්ම සාර්ව විශ්ලේෂණයක ද, දෙවනුව සූක්ෂම විශ්ලේෂණයක ද යෙදිය යුතු බව උදාහරණ සහිතව පැහැදිලි වන සේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කළයුතු වේ.

අටවන ප්‍රශ්නයෙහි (iv) (අ) අනුකොටසෙහි පහසුතාව 35%කි. මෙසේ අඩු පහසුතාවයක් දැක්වීමට හේතුව ව්‍යාපාරයක මූල්‍ය සැලැස්මෙහි ඇතුළත් විය යුතු ප්‍රධාන කොටස් නම් කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වීමයි. ව්‍යාපාරයක මූල්‍ය සැලැස්මක් අපේක්ෂකයන් විසින් ප්‍රායෝගිකව සකස් කිරීම මගින් මූල්‍ය සැලැස්ම පිළිබඳ අවබෝධය ප්‍රගුණ කළ හැකිය.

අටවන ප්‍රශ්නයෙහි (v) අනුකොටසෙහි පහසුතාව 17%කි. මෙසේ පහසුතාව පහළ යාමට හේතුව වන්නේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන පුද්ගලයෙකුට මූල්‍ය විශ්ලේෂණයකින් ගතහැකි තීරණ පිළිබඳව අපේක්ෂකයන් තුළ අවබෝධයක් නොමැති වීමයි. එහෙයින් මූල්‍ය සැලැස්මට අදාළව මූල්‍ය වාර්තා විශ්ලේෂණය පිළිබඳව අවබෝධයක් අපේක්ෂකයින්ට ලබාදිය හැකිවන සේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කළ යුතු වේ.

2.2.3 II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා



II ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න අංක 01, 02, 03 හා 04 යන ප්‍රශ්න I වන කොටසට අයත් වේ. ප්‍රශ්න 05, 06, 07 හා 08 යන ප්‍රශ්න II කොටසට අයත් වේ. එම කොටස් දෙකෙන් අවම වශයෙන් එක කොටසකින් ප්‍රශ්න දෙකක් බැගින් තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතු වේ.

I කොටසේ 63%ක් වූ ඉහළම පහසුතාවක් දැකිය හැක්කේ තුන්වන ප්‍රශ්නයට වන අතර, අඩුම පහසුතාව වූ 54% දැකිය හැක්කේ හතරවන ප්‍රශ්නයට ය.

II කොටසේ 51%ක් වූ ඉහළම පහසුතාව පස්වන ප්‍රශ්නය හා හත්වන ප්‍රශ්නය සඳහාත්, අඩුම පහසුතාව වූ 38% අටවන ප්‍රශ්නය සඳහාත් දැකිය හැකි ය.

I වන හා II වන කොටස්වල සමස්ත පහසුතාව විමසා බැලීමේ දී I කොටසේ සමස්ත සාමාන්‍ය පහසුතාව 59%කි. එමෙන්ම II කොටසේ සාමාන්‍ය සමස්ත පහසුතාව 47%කි.

III කොටස

3 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා :

3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :

පොදු උපදෙස් :

- ⋆ ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතුය. එනම් එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද කුමන ප්‍රශ්න අනිවාර්ය වේ ද කොපමණ ලකුණු ලැබේ ද කොපමණ කාලයක් ලැබේ ද යන කරුණු පිළිබඳව සැලකිලිමත් විය යුතු අතර, ප්‍රශ්න හොඳින් කියවා පිළිතුරු ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන ප්‍රශ්න පිළිබඳව නිරවුල් අවබෝධයක් ඇති කර ගෙන පිළිතුරු ලිවිය යුතුය.
- ⋆ I පත්‍රයේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය. කාලය පැය දෙකයි.
- ⋆ II පත්‍රයේ I හා II උප කොටස්වලින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරාගෙන මුළු ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. කාලය පැය තුනයි.
- ⋆ සෑම ප්‍රධාන ප්‍රශ්නයක්ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතුය.
- ⋆ අයදුම්කරුගේ විභාග අංකය සෑම පිටුවකම අදාළ ස්ථානයේ ලිවිය යුතුය.
- ⋆ ප්‍රශ්න අංක හා අනුකොටස් අංක නිවැරදිව සඳහන් කළ යුතුය.
- ⋆ සියලුම ප්‍රශ්න හොඳින් කියවා පිළිතුරු ලිවිය යුතුය. ප්‍රශ්න යටතේ දී ඇති තොරතුරුත්, ලබා ගත යුතු පිළිතුරු හෝ සාධනය කළ යුතු ප්‍රතිඵල කවරේ ද යන්නත් පැහැදිලිව අවබෝධ කර ගත යුතුය.
- ⋆ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී දී ඇති කාලය නිසි පරිදි කළමනාකරණය කර ගැනීමට වග බලා ගත යුතුය.
- ⋆ පැහැදිලි අත් අකුරින් පිළිතුරු සැපයිය යුතුය. පිළිතුරු ලිවීමේදී නිල් පාට හෝ කළු පාට පෑන් පමණක් භාවිත කළ යුතුය. අනෙකුත් පාට පෑන් භාවිත කිරීමෙන් වැළකිය යුතුය.
- ⋆ නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවලදී දීර්ඝ විස්තර ඇතුළත් නොකිරීම මෙන්ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවලදී කෙටි පිළිතුරු සැපයීමද නොකළ යුතුය.

විශේෂ උපදෙස් :

- * ප්‍රශ්න අංක 01 සිට 30 දක්වා බහුවරණ ප්‍රශ්න සඳහා නියමිත ස්ථානයේ නිවැරදි වරණයේ අංකය පෑනකින් සටහන් කළ යුතු යි.
- * ප්‍රශ්න අංක 31 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළ හිස්තැනෙහි සුදුසු වචන ලියා හිස්තැන් පිරවිය යුතු යි.
- * ප්‍රශ්න අංක 41 සිට 50 තෙක් ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු අදාළ ස්ථානයේ ලිවීම කළ යුතු යි.
- * ඒ ඒ ප්‍රශ්නය යටතේ ප්‍රශ්න අනු කොටස් සියල්ලටම නිවැරදි ඉලක්ක ගත පිළිතුරු ලිවිය යුතු ය.
- * තර්කානුකූලව හා විශ්ලේෂණාත්මකව අදාළ කරුණු ඉදිරිපත් කළ යුතු ය.

3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා :

* ව්‍යාපාර අධ්‍යයනය විෂයයේ ස්වභාවය පිළිබඳ ව ගුරුවරයා ගැඹුරු හා පුළුල් අවබෝධයකින් ද යාවත්කාලීන වූ දැනුමකින් ද යුතුව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට ප්‍රවේශ විය යුතුය. ව්‍යාපාර අධ්‍යයනය දිනෙන් දින වෙනස් වන විෂයය කරුණු රාශියකින් යුක්ත වේ. එමනිසා එම වෙනස්වීම් පිළිබඳ ව දැනුවත් වීමට ගුරුවරයා සමත් විය යුතුය.

* ව්‍යාපාර අධ්‍යයනය විෂයය න්‍යායාත්මක දැනුමෙන් ඔබ්බට විහිදෙන විෂයයකි. එම නිසා එම විෂයයට ආදරය කිරීමටත් එම විෂයය ක්ෂේත්‍රය තුළ ජීවත්වීමටත් (Love & Live) ගුරුවරයා සමත් විය යුතු අතර ඒ සඳහා අපේක්ෂකයින්ට මඟ පෙන්වීමක් ද කළ යුතුය.

* ව්‍යාපාර අධ්‍යයනය විෂයය උගන්වන ගුරුවරයා පන්ති කාමරය තුළ සිදුවන සාමාන්‍ය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට අමතරව කණ්ඩායම් ක්‍රියාකාරකම් ක්ෂේත්‍ර චාරිකා, ව්‍යාපෘති, ප්‍රදර්ශන, ඉදිරිපත් කිරීම් වැනි ක්‍රියාකාරකම් විෂයය පිළිබඳ ව දැනුවත් කිරීම සඳහා භාවිත කළ යුතුය. විෂයය තුළ පවතින සංකල්ප තහවුරු කිරීමට හැකි සෑම අවස්ථාවකදී ම සිද්ධි අධ්‍යයනයන් යොදා ගත යුතුය. මෙම ක්‍රියාකාරකම්වලදී අපේක්ෂකයින්ගේ උපරිම සහභාගිත්වය සඳහා ඉඩ සැලසෙන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතුය. ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුළින් විෂය කොටස් අවබෝධයට හා භාවිතයට අපේක්ෂකයින්ට ඉඩ ප්‍රස්ථා ලබා දිය යුතුය.

* විෂයය දැනුම තහවුරු කිරීමේදී පහසුකම් අනුව වීඩියෝ දර්ශන, පරිගණක මෘදුකාංග, අන්තර්ජාල භාවිතය වැනි අවස්ථාද බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍ර වැනි නවීන තාක්‍ෂණික උපක්‍රම ද භාවිත කිරීම වඩා සුදුසුය.

* විෂයය අවබෝධය හා දැනුම යාවත්කාලීන කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව සහ අනෙකුත් ප්‍රකාශන, වාර්ෂික අයවැය යෝජනා, විෂය කරුණුවලට අදාළ අණ පනත්, නියෝග, නීතිරීති, ආයතනික පහසුකම් සපයන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වැනි සංවිධානවල නිල ප්‍රකාශන පරිශීලනය කළ යුතුය.

* ව්‍යාපාර අධ්‍යයනය විෂය නිර්දේශයේ අභිමතාර්ථ පරීක්ෂා කිරීමේදී ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය මගින් ඉටුකර ගත යුතු සුවිශේෂී අභිමතාර්ථ පද්ධතියක් ඇත. එම අභිමතාර්ථ ප්‍රධාන වශයෙන් එදිනෙදා ජීවිතයට අවශ්‍ය දැනුම, කුසලතා හා ආකල්ප ලබාදෙන පරිදි සකස් කර ඇත. මීට අමතරව අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනැගෙන ජීවන පුරුදු බවට ඉගෙනුම් ඵලය සකස් විය යුතුය. එම අභිමතාර්ථ සාක්ෂාත් කරගත හැකිවන පරිදි ව්‍යාපාර අධ්‍යයනය විෂය ඉගැන්වීමේදී විවිධ ක්‍රම අනුගමනය කිරීමට ගුරුවරයා සැලකිලිමත් විය යුතුය. ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය මගින් පෙන්වා දෙන මඟපෙන්වීම් ඔස්සේ ගුරුභවතා විසින් උචිත ක්‍රමවේද භාවිත කිරීම සාර්ථක ඉගෙනුම්- ඉගැන්වීම් වැඩ පිළිවෙළකට හේතුවනු ඇත.

* ගුරුවරයා තම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුරදී අපේක්ෂකයින් ඇගයීමට ලක්කළ යුතුය. පන්ති කාමරය තුළ අපේක්ෂකයින් ඉගෙනීමෙහි යෙදී සිටින අතරතුරදී ගුරුවරයාට ඔවුන්ගේ ඉගෙනුම් හැකියා, නොහැකියා හා ප්‍රවීණතා පිළිබඳ ව අවබෝධ කරගැනීමට එමඟින් හැකියාව ලැබෙනු ඇත. ඒ අනුව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුරදීම අපේක්ෂකයින්ගේ දුර්වලතා හඳුනා ගෙන ඒ සඳහා ප්‍රතිපෝෂණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කර ගත යුතුය.

* ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි අඩංගු අභ්‍යාස කිරීමට අපේක්ෂකයින්ගේ අවධානය යොමුවන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීමට උනන්දු විය යුතුය.

* ප්‍රශ්නයේ සඳහන් වන නිර්වචනය, අර්ථකථනය යන පද එකිනෙකට වෙනස් බව පෙන්වා දිය යුතුය. එමෙන්ම විමසන්න, පැහැදිලි කරන්න, විස්තර කරන්න, හඳුන්වන්න යන පද එකනෙකට වෙනස් අර්ථ දක්වන බව අපේක්ෂකයින්ට අවබෝධ කර දෙමින් එකිනෙකට වෙනස් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට ඔවුන් යොමු කරවිය යුතුය.

* ගුරුවරයා තමන්ගේ දැනුම භාවිත කරමින් කුඩා සිද්ධි අධ්‍යයන නිර්මාණය කර ඒ සඳහා න්‍යායාත්මක දැනුම යොදා ගන්නා ආකාරය අපේක්ෂකයින් සමඟ සාකච්ඡා කිරීම තුළින් එවැනි ප්‍රශ්න සඳහා ඔවුන් සූදානම් කළ හැකිය.

* ව්‍යාපාර අධ්‍යයනය විෂයේ II ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් දෙකකින් සමන්විතය. මෙහි I වන කොටස 12 වන ශ්‍රේණියටත් II වන කොටස 13 වන ශ්‍රේණියටත් අදාළ වේ. සමස්ත ඇගයීම් දෙස බලන විට පෙනී යන්නේ I වන කොටස සඳහා වැඩිපුර ලකුණු ලබා ගෙන ඇති තත්ත්වයක් වුව ද II වන කොටස සඳහා අඩු ලකුණු ප්‍රමාණයක් ලබා ඇති තත්ත්වයකි. එම නිසා 13 වන ශ්‍රේණියට අදාළ පාඩම් ඒකක කෙරෙහි වැඩි අවධානයක් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී යොමු කළ යුතුය. ඒ සමඟම II වන කොටසේ ප්‍රශ්නවලට අපේක්ෂකයින් වැඩියෙන් පුරුදු පුහුණු කිරීමේ අවශ්‍යතාවයක් පවතින බව වටහාගත යුතුව ඇත.

* බ්ලුම්ගේ වර්ගීකරණයට අනුව දැනුම, අවබෝධය, භාවිතය, විග්‍රහය, ඇගයීම හා නිර්මාණය යන ඉගෙනුම් මට්ටම් II ප්‍රශ්න පත්‍රයේ සාධන මට්ටම් සමග සැසඳීමේ දී එතරම් සාර්ථකත්වයක් දැකිය නොහැකිය. එහි නිර්මාණය හා අවබෝධය යන ඉගෙනුම් මට්ටම් ඉතා අඩුම මට්ටමක ද දැනුම හා භාවිතය මධ්‍යස්ථ මට්ටමක ද පෙන්වන අතර තරමක සාර්ථකත්වයක් දැකිය හැකි වන්නේ විග්‍රහය හා ඇගයීම් යන මට්ටම්වලදී පමණි. එම නිසා දැනුම, අවබෝධය, භාවිතය, විග්‍රහය, ඇගයීම හා නිර්මාණය යන සියලුම නිපුණතාවන් අපේක්ෂකයන්ට ලබා දෙන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කළ යුතු වේ.

* අ.පො.ස. (උසස්.පෙළ) ව්‍යාපාර අධ්‍යයනය ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු සපයා ඇති ආකාරය දෙස බලන විට ව්‍යාපාර අධ්‍යයනය විෂයය හා සම්බන්ධ සංකල්ප, පාරිභාෂික පද, නව ප්‍රවණතා පිළිබඳ ව අපේක්ෂකයින් තුළ ඇති දැනුම ප්‍රමාණවත් නොවන බව පෙනී යයි. එමෙන්ම පිළිතුරු නිවැරදි ව ගළපා පැහැදිලි ව ඉදිරිපත් කිරීමට අපේක්ෂකයින් නිපුණතාව ලබා නොමැති බවද පෙනී යන තවත් කරුණකි. එම නිසා එම කරුණු කෙරෙහි පන්ති කාමර ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියේදී අවධානය යොමු කළ යුතුය.